# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

---

**[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

---


2007 සැප්තැම්බර් මස 21 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

මිල : රු. 24.00 යි. තැපැල් ගාස්තුව : රු. 12.50 යි

## 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත

[සහතිකය සටහන් කළේ 2007 සැප්තැම්බර් මස 18 වන දින]

එල්. ඩී. —ඕ. 40/2006.

**ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවීම සඳහා ද; නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සංවර්ධනය කිරීම සඳහා ද; බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සඳහා ද; බලශක්ති කාර්යක්ෂමතා ක්‍රමවේද සහ සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිණිස ද; බලශක්ති සුරක්ෂණය ප්‍රවර්ධනය කිරීම, නැවත බලගැන්විය හැකි බලශක්ති සැපයීම හා පිරිවැය සඵලතාවය සහ තොරතුරු කළමනාකරණය ප්‍රවර්ධනය කිරීම පිණිස සහ 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල් පනත ඉවත් කිරීම පිණිස සඳහා සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මකවන දිනය.

1. මේ පනත 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි (මෙහි මින් මතු “නියමිත දිනය” යනුවෙන් සඳහන් කරනු ලබන) යම් දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතු ය.

### I වන කොටස

### ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවීම

ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පිහිටුවීම.

**2.** (1) (මෙහි මින් මතු “අධිකාරිය” යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය යනුවෙන් හඳුන්වන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය, (1) වන උපවගන්තිය යටතේ ඊට පවරන ලද නාමයෙන් අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් ඇති සංස්ථාවක් විය යුතු අතර, ඒ නාමයෙන් අධිකාරිය විසින් ද, අධිකාරියට විරුද්ධව ද, නඩු පවරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ සංයුතිය.

**3**. (1) අධිකාරියේ කටයුතු කළමනාකරණය සහ පරිපාලනය කිරීම (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලයක් වෙත පැවරෙන අතර, එය පහත දැක්වෙන අයගෙන් සමන්විත විය යුතු ය:—

(අ) නිල බලයෙන් පත්වන පහත දැක්වෙන සාමාජිකයන්:—

(i) විදුලිබල හා බලශක්ති විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක් ;

(ii) පළාත් පාලන සහ පළාත් සභා විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(iii) කර්මාන්ත සහ ආයෝජන ප්‍රවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(iv) ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(v) කෘෂිකර්ම විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(vi) වැවිලි කර්මාන්ත විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(vii) පරිසර විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(viii) වාරිමාර්ග සහ මහවැලි සංවර්ධන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(ix) ප්‍රවාහන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(x) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්;

(xi) විද්‍යා හා තාක්ෂණ විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඔහුගේ නාමිකයෙක්; සහ

(xii) ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා :

එසේ වුව ද, (i) සිට (xi) දක්වා වූ අනුඡේදවල නිශ්චිතව සඳහන් කර ඇති විෂයයන් දෙකක් හෝ ඊට වැඩි ගණනක් තනි අමාත්‍යවරයකුට පවරා හෝ ඒ අමාත්‍යවරයාගේ භාරයේ පවතින අවස්ථාවක දී, ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා හෝ ඒ අමාත්‍යාංශයට එක් ලේකම්වරයකුට වඩා වැඩි ගණනක් පත් කර ඇති අවස්ථාවක දී ඒ ලේකම්වරු අතරින් එක් අයකු පමණක්, මේ ඡේදය යටතේ මණ්ඩලයේ සාමාජිකයකු බවට පත් විය යුතු ය;

(ආ) (මෙහි මින් මතු "පත්කළ සාමාජිකයන් "යනුවෙන් සඳහන් කරනු ලබන) අමාත්‍යවරයා විසින් පත් කළ යුතු පහත සඳහන් තැනැත්තන් :—

(i) ශ්‍රී ලංකා බලශක්ති කළමනාකරුවන්ගේ සංගමය විසින් නම් කරන ලද එම සංගමයේ අනුයෝජිතයෙක්;

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරන ලද ශ්‍රී ලංකා මූල්‍ය සංවර්ධන බැංකු නියෝජනය කිරීම සඳහා වූ තැනැත්තෙක් ;

(iii) නැවත බලගැන්විය හැකි බලශක්ති කර්මාන්තය නියෝජනය කිරීම සඳහා වූ තැනැත්තෙක් ;

(iv) ශ්‍රී ලංකා වාණිජ ඒ මණ්ඩලය විසින් නම් කරන ලද එම මණ්ඩලයේ අනුයෝජිතයෙක් ;

(v) ව්‍යාපාරික, ඉංජිනේරු, මූල්‍ය, කළමනාකරණ හෝ නීති යන ක්ෂේත්‍රවල සුදුසුකම් ලත් සහ ඒ ක්ෂේත්‍රවල දැනුම සහ පළපුරුද්ද පෙන්වා ඇති තැනැත්තන් තුන් දෙනෙක් ;

(vi) ග්‍රාමීය බලශක්ති සේවා අංශය නියෝජනය කරන තැනැත්තෙක් ; සහ

(vii) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු, නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධනය හෝ බලශක්ති සංරක්ෂණ සහ කාර්යක්ෂමතාව යන ක්ෂේත්‍රවල පළපුරුද්දක් ඇති තැනැත්තෙක්.

(2) මේ පනතේ උපලේඛනයේ විධිවිධාන මණ්ඩලයේ සාමාජිකයන්, එහි රැස්වීම් සහ මණ්ඩලයේ මුද්‍රාව සම්බන්ධයෙන් අදාළ කරගනු ලැබිය යුතු ය.

අධිකාරියේ පරමාර්ථ.

4. අධිකාරියේ පරමාර්ථ:—

(අ) බලශක්ති සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීමේ අරමුණින් නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් හඳුනාගැනීම, තක්සේරු කිරීම සහ සංවර්ධනය කිරීම හා ඒ මගින් රටට ආර්ථික සහ සමාජ ප්‍රතිලාභ ව්‍යුත්පන්න කිරීම ;

(ආ) ගෘහස්ත, වාණිජමය, කෘෂිකාර්මික, ප්‍රවාහන, කාර්මික සහ වෙනත් යම් අදාළ අංශයක භාවිතය සඳහා බලශක්තිය භාවිත කිරීම පිළිබඳ බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම සහ බලශක්ති සංරක්ෂණ වැඩසටහන් හඳුනාගැනීම, ප්‍රවර්ධනය කිරීම, සුසාධනය, ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ඇ) ප්‍රතිපත්ති වැඩිදියුණු කිරීමෙන් හා විශ්ලේෂණය කිරීමෙන් සහ අදාළ තොරතුරු කළමනාකරණය මගින් රට තුළ බලශක්තිය බෙදාහැරීම පිළිබඳ සුරක්ෂිතභාවය, විශ්වාසනීයත්වය සහ පිරිවැය සඵලතාවය ප්‍රවර්ධනය කිරීම; සහ

(ඈ) ජාතියේ යහපත උදෙසා බලශක්තිවල අවම ආර්ථික පිරිවැයට සහ බලශක්තිවල සුරක්ෂිතභාවයට අනුරූප වන පරිදි අධිකාරියට ස්වකීය පරමාර්ථ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් අරමුදල් පවතින බව තහවුරු කිරීම,

විය යුතු ය.

## II වන කොටස

## මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

**5**. මණ්ඩලය විසින් පහත දැක්වෙන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම කරනු ලැබිය යුතු ය :— මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය.

(අ) බලශක්ති පිළිබඳව ජාතික ප්‍රතිපත්තියක් සකස්කිරීම සඳහා අමාත්‍යවරයාට සහාය වීම ;

(ආ) (i) වැඩ බිම්වල භූගෝලීය පිහිටීම, ඵල ප්‍රයෝජන ලබා ගැනීමේ හැකියාව, ඉඩම් අයිතිය සහ පවතින යටිතල පහසුකම් පෙන්නුම් කරන ශ්‍රී ලංකාවේ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සියල්ල පිළිබඳව තොග ලේඛනයක් සකස් කිරීම, පවත්වාගෙන යාම සහ ඒවා යාවත්කාලීන කිරීම ; සහ

(ii) වාණිජමය වශයෙන් ඵල ප්‍රයෝජන ලබා ගැනීම සඳහා නැවත බලගැන්විය හැකි බලශක්ති තාක්ෂණවල පරිණත මට්ටම් දක්වමින් සහ දර්ශීය කර්තව්‍ය දත්ත දක්වමින් පරිදි නැවත බලගැන්විය හැකි බලශක්ති තාක්ෂණ සියල්ල පිළිබඳ තොග ලේඛනයක් සකස් කිරීම, පවත්වා ගෙන යාම සහ ඒවා යාවත්කාලීන කිරීම,

ඇතුළුව, නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සියල්ල සහ යෝග්‍ය පරිවර්තන තාක්ෂණයන්, පරිවර්තන සහ භාවිතයන් පිළිබඳ සම්මතයන් සහ පරිචයන් හඳුනා ගැනීම, සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම ;

(ඇ) රට තුල නැවත බලගැන්විය හැකි බලශක්ති වැඩි දියුණු කිරීම සඳහා-

(i) නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති පිළිබඳව මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම සහ ඒවා අපේක්ෂිත ආයෝජකයන් අතරේ ව්‍යාප්ත කිරීම ;

(ii) අදාළ රාජ්‍ය නියෝජ්‍යායතන සමග එකතුව මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති අගැයීම සහ අනුමත කිරීම පිළිබඳ මාර්ගෝපදේශ වැඩි දියුණු කිරීම ;

(iii) මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘති කර ගෙනයාම සඳහා ඉල්ලුම්පත් භාර ගැනීම ;

(iv) අලුත් ආකාරයේ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සහ තාක්ෂණයන් පිළිබඳ ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කිරීම මගින් ආයෝජකයන්ට සහාය ලබා දීම ; සහ

(v) බලශක්ති පිළිබඳ ජාතික ප්‍රතිපත්තියකට අනුකූලව නැවත බලගැන්විය හැකි බලශක්ති වැඩිදියුණු කිරීමේ වර්ධනය අඩපණ කරන තාක්ෂණයන් හෝ වෙනත් යම් සීමාවන්ට විසඳුම් ලබා දීමේ මාර්ග සොයා බැලීම සහ වැඩ සටහන් සඳහා සුහසාධනය,

ඇතුළුව, ආයෝජකයන් දිරිමත් කරන සහ ඒවා ප්‍රවර්ධනය කිරීමට සාධනීය පරිසරයක් ඇති කිරීම ;

(ඈ) (i) විශේෂ තාක්ෂණයන් සඳහා වන අන්තර්කාලීන ඉලක්ක සහිත දීර්ඝ කාලීන සංවර්ධන සැලැස්මවල් පිළියෙල කිරීම සහ එම සංවර්ධන සැලැස්මවල් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ප්‍රවර්ධනය කිරීම ; සහ

(ii) තරගකාරීත්වයේ මූලධර්ම මත පදනම් කරගත් යාන්ත්‍රික දිරිගැන්වීමේ උපක්‍රම සහ තත්ත්වාකාරයෙන් වූ බලශක්ති නිෂ්පාදනය පදනම් කර ගත් විශේෂිත තාක්ෂණයන් සඳහා දිරිමත් කිරීමේ පියවර සොයා ගැනීම,

ඇතුළුව, නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධනය කිරීම අරමුණු කරගත් ප්‍රතිපත්ති විශ්ලේෂණය කොට නිර්දේශ කිරීම සහ ඒ සඳහා සැලසුම් සකස් කිරීම ;

(ඉ) රට තුල බලශක්ති අංශයේ සුනිත්‍යභාවය සහ යහපත් පැවැත්ම සනාථ කිරීම සඳහා—

(i) ණය වැඩිදුරටත් ලබා දීම ඉහල නැංවීම හා වෙනත් පහසුකම් මාර්ගයෙන් නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධනය, බලශක්ති කාර්යක්ෂමතා ප්‍රවර්ධනය සහ ග්‍රාමීය බලශක්ති සේවා වැඩි දියුණු කිරීම සහ සංරක්ෂණය කිරීම සඳහා අරමුදල් රැස්කිරීමට වැඩ සටහන් ප්‍රවර්ධනය කිරීම ; සහ

(ii) ආනයනික බලශක්ති මත යැපීම අඩු කරනු ලබන, නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධනය, බලශක්ති කාර්යක්ෂමතා වැඩි දියුණු කිරීම, සංරක්ෂණය සහ ග්‍රාමීය බලශක්ති සේවා යන ආකාරයෙන් වූ නියමු ව්‍යාපෘති සඳහා, ආධාර සහ ආරම්භක ප්‍රාග්ධනය ඇතුළුව අරමුදල් සැපයීම,

ඇතුළුව, නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධනය, බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම් සහ සංරක්ෂණය, ග්‍රාමීය බලශක්ති සේවා සඳහා ආයෝජනයන් වැඩි දියුණු කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සඳහා හේතු වන සාධනීය පරිසරයක් ඇති කිරීම ;

(ඊ) බලශක්ති අංශයේ පරදු දරන්නන්ගේ හැකියා සංවර්ධනය සඳහා සහ අධිකාරියේ පරමාර්ථවලට අනුකූලව යම් පරදු දරන්නෙක් විසින් කරගෙන යන්නා වූ පර්යේෂණ සහ සංවර්ධන ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහ මූල්‍ය සහාය සැපයීම ;

(උ) (i) බාධක ඉවත් කර වාණිජමය මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීමට ව්‍යාපෘති සංවර්ධනකරුවන්ට සහාය වන නව යෝජනා ක්‍රම නිර්මාණය කිරීම, සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ; සහ

(ii) යම් සංවිධානයක් විසින් ආරම්භ කරන ලද යම් පරිසර ආරක්ෂණයක් යටතේ ලබා ගැනීමට හැකි සහනදායී මූල්‍ය පහසුකම් සඳහා ප්‍රවේශ වීමට ව්‍යාපෘති සංවර්ධනකරුවන්ට පහසුකම් සැලසීම සහ සහාය වීම,

ඇතුළුව, පිරිසිදු සංවර්ධන යාන්ත්‍රණය සඳහා වූ නාමෝද්දිෂ්ට ජාතික නියෝජ්‍යායතනය සහ ව්‍යාපෘති සංවර්ධනකරුවන්හට බලශක්ති අංශයේ පිරිසිදු සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාකාරකම් සඳහා තාක්ෂණික සහාය ලබා දෙනු ලබන ශ්‍රී ලංකාවේ ජාතික තාක්ෂණික සේවා නියෝජ්‍යායතනයක් ලෙස ක්‍රියා කිරීම ;

(ඌ) නැවත බලගැන්විය හැකි බලශක්ති විභවයන් පිළිබඳ විමසා බැලීම පිණිස යම් භූගෝලීය ප්‍රදේශයක මූලික අධ්‍යයන සහ විමර්ශන පැවැත්වීම ;

(එ) අමාත්‍යවරයා විසින් කරනු ලැබිය හැකි කිසියම් විධානයකට යටත්ව යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සැලසුම් කිරීම සහ තක්සේරු කිරීම පිළිබඳව අවශ්‍ය දත්ත රැස් කිරීම සහ එම සැලසුම් කිරීම් සහ තක්සේරු කිරීම් කර ගෙන යාම ;

(ඒ) යම් රාජ්‍ය හෝ පුද්ගලික ආයතන හෝ වෙනත් යම් මූලාශ්‍රයන්ගෙන් නැවත බලගැන්විය හැකි බලශක්ති සැළසුම් කිරීම සහ තක්සේරු කිරීම්වලට අවශ්‍ය කරන අදාල දත්ත ලබා ගැනීම ;

(ඔ) අදාල නියෝජ්‍යායතන විමසා මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති නියාමනය කිරීම, ඒවා වඩා හොඳ තත්ත්වයකට පත් කිරීම හා දිගටම කරගෙනයාම සහ ක්‍රියාමය අවශ්‍යතාවයන් සරල කිරීමට සහ අනුමත යාන්ත්‍රික උපක්‍රම ව්‍යාපෘති වේගය වැඩි කිරීමට යම් නියෝජ්‍යායතනවලට තාක්ෂණ සහ වෙනත් සේවා සහ සැපයුම් සහාය ලබා දීම සහ පහසුකම් සැපයීම ;

(ඕ) බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම හා සංරක්ෂණ පියවර සහ ග්‍රාමීය බලශක්ති සේවා සඳහා ක්‍රියාත්මක මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති ආයෝජකයන් සඳහා හරිත අරමුදල්වලට ප්‍රවේශවීමට පහසුකම් සැලසීම ;

(ක) අරමුදල් සැපයීම සහ ණය ඇපකර යෝජනාක්‍රම හා මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපාතිවල ආයෝජන සඳහා වාණිජ ණය ගැනීම්වලට ප්‍රවේශවීම වැනි, ණය වැඩිදුරටත් ලබාදීමේ පහසුකම් නිර්මාණය කිරීම, වැඩිදියුණු කිරීම සහ ක්‍රියාත්මක කිරීම, බලශක්ති කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා ආයෝජනය කිරීම සහ බලශක්ති අංශයේ සංරක්ෂණය සහ දැනුම කළමනාකරණය කිරීම;

(ග) අධිකාරියේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට අමාත්‍යවරයා විසින් අනුමත කරන ලද යම් තැනැත්තකු සමග ඒකාබද්ධ යෝජනා ක්‍රමයකට ඇතුළත්වීම ;

(ච) රජයේ සහ පුද්ගලික අංශයේ සංවිධාන සඳහා සහ ඒ වෙනුවෙන්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් ගාස්තු ලෙස අයකර නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් වැඩි දියුණු කිරීම සහ බලශක්තිවල කාර්යක්ෂමතාවය වැඩි දියුණු කිරීම, බලශක්ති සංරක්ෂණය සහ අවශ්‍යතා කළමනාකරණයට අදාළ වෘත්තීය සේවා ලබා දීම සහ ව්‍යාපෘති භාර ගැනීම ; සහ

(ජ) අධිකාරියේ පරමාර්ථ මුදුන් පත් කර ගැනීමට අවශ්‍ය විය හැකි හෝ උපකාර විය හැකි වෙනත් යම් වැඩසටහන් ආරම්භ කිරීම හා ක්‍රියාත්මක කිරීම සහ වෙනත් යම් ක්‍රියාවන් සිදු කිරීම.

මණ්ඩලයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය පැවරීම.

**6**. (1) ලියවිල්ලකින් නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව, මණ්ඩලය විසින් මේ පනත යටතේ එහි බලතල, කාර්ය හෝ කර්තව්‍යවලින් කිසිවක් මණ්ඩලයේ සභාපතිවරයාට හෝ වෙනත් යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට පැවරීම කරනු ලැබිය හැකි ය. මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි යම් විශේෂ හෝ සාමාන්‍ය විධානයන්ට යටත්ව, සභාපතිවරයා හෝ එම නිලධරයා හෝ සේවානියුක්තයා විසින් ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක් නොතකා මණ්ඩලය විසින් එසේ පවරනු ලැබූ ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

ප්‍රභව සිතියම් සහ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් පිළිබඳ ලැයිස්තුවක් සකස් කිරීම.

**7**. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමිත දිනයේ සිට මාස හයක් ඇතුළත, රට තුළ ඇත්තා වූ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සියල්ල පිළිබඳව සමීක්ෂණයක් සහ තක්සේරු කිරීමක් සිදු කිරීම ආරම්භ කිරීමට සලස්වනු ලැබිය යුතු අතර, එක් එක් සංවර්ධන ප්‍රදේශය සම්බන්ධයෙන් නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් පිළිබඳ තොග ලේඛනයක් සහ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් දැක්වෙන ප්‍රභව සිතියමක් සකස් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් දැක්වෙන ප්‍රභව සිතියම සහ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් පිළිබඳ තොග ලේඛනය සකස් කිරීමේ දී, අධ්‍යක්ෂ ජනරාල්වරයා

විසින් රජයේ දෙපාර්තමේන්තු, ආයතන සහ වෙනත් යම් නියෝජ්‍යායතන හෝ තැනැත්තන් විසින් රැස්කර ගත් හෝ එකතු කරගත් අදාල දත්ත, තොරතුරු, සිතියම්, ලේඛණ හෝ වාර්තා සැලකිල්ලට ගනිමින් කටයුතු කළ යුතු ය. නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් දැක්වෙන ප්‍රභව සිතියම් සහ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් පිළිබඳ ලැයිස්තුවක් සකස් කිරීමේ කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට බොහෝ දුරට අවශ්‍ය විය හැකි එවැනි යම් දත්ත, තොරතුරු, සිතියම්, ලේඛණ හෝ වාර්තා සැපයීම, එවැනි දෙපාර්තමේන්තුවල,ආයතනවල හෝ වෙනත් නියෝජ්‍යායතනවල ප්‍රධානීන්ගේ හෝ තැනැත්තන්ගේ කාර්ය විය යුතු ය.

නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් වැඩිදියුණු කිරීමේ සැලසුම්.

8. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියමිත දිනයෙන් පසුව වසර තුනකට නොඅඩු කාලයක් තුළ දී, 7 වන වගන්තිය යටතේ කරනු ලැබූ සමීක්ෂණයේ සහ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් තක්සේරු කිරීමේ ප්‍රතිඵල මුල්කරගෙන (මෙහි මින් මතු "සැලසුම" යනුවෙන් හඳුන්වනු ලබන) නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සංවර්ධනය පිළිබඳ පරිපූර්ණ සැලසුමක් මණ්ඩලය වෙත භාරදිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, ඒ සැලසුම ලැබුණ දින සිට දින තිහක් ඇතුළත, එහි වෙනස්කම් කිසිවක් වේ නම් ඒවා සකස්කර, ඒ සැලසුම අමාත්‍යවරයා වෙත භාරදිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින්, සිංහල, දෙමළ සහ ඉංග්‍රීසි යන එක් එක් භාෂාවලින් පළවන පුවත්පතක පළ කරනු ලබන දැන්වීමක් මගින්, (2) වන උපවගන්තිය යටතේ තමාට ඉදිරිපත් කරන ලද සැලසුම මහජනතාව විසින් පරීක්ෂා කළ හැකි ස්ථාන සහ වේලාවන් දැනුම් දිය යුතු අතර, ඒ පිළිබඳ අදහස් කිසිවක් ඇත්නම්, ඒ දැන්වීම පළකිරීමෙන් දින තිහක් ඇතුළත එම අදහස් ඉදිරිපත් කිරීමට මහජනතාවට ඉඩ දිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කරන ලද දින තිහක කාලය අවසානයේ දී අමාත්‍යවරයා විසින් ඒ උපවගන්තිය යටතේ මහජනතාව විසින් ඔහු වෙත ඉදිරිපත් කරන ලද අදහස් සැලකිල්ලට ගනිමින්, ඔහු විසින් අවශ්‍ය යයි සලකනු ලබන යම් වෙනස් කිරීම් කිසිවක් වේ නම් ඒවාට යටත්ව, තාවකාලිකව ඒ සැලසුම අනුමත කරනු ලැබිය හැකි අතර, එය අනුමතය සඳහා අමාත්‍ය මණ්ඩලය වෙත භාර දිය යුතු ය.

(5) අමාත්‍ය මණ්ඩලය විසින් ඒ සැලසුම අනුමත කිරීමෙන් පසු, අමාත්‍යවරයා විසින් ඒ සැලසුම ගැසට් පත්‍රයේ පළකරනු ලැබීමට සැලැස්විය යුතු අතර, එය එසේ පළ කිරීමේ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් පසු දිනයක දී සිට ක්‍රියාත්මක විය යුතු ය.

(6) ඒ සැලසුම ක්‍රියාත්මක වන දිනයෙන් ආරම්භ වන සෑම වසර තුනකට වරක් මණ්ඩලය විසින් ඒ සැලසුම සංශෝධනය කරනු ලැබිය යුතු අතර, ඒ සෑම සංශෝධනයක්ම සහ සංශෝධනයන් සම්බන්ධයෙන්, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, (2) වන, (3) වන, (4) වන සහ (5) වන උපවගන්තිවල විධිවිධාන අදාළ කරගනු ලැබිය යුතු ය.

(7) අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ නිර්දේශය මත, සැලසුමට සහ සැලසුමේ සඳහන් කරන ලද උපායමාර්ගවලට බලාත්මක භාවයක් ලබාදීමට අවශ්‍ය විය හැකි යම් පියවර, නියම කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

## ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව සහ උපදේශක කමිටු

උපදේශක කමිටු පත්කිරීම.

**9**. (1) මණ්ඩලය විසින් මේ පනත යටතේ සිය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා සහාය වීම පිණිස, අධ්‍යාපනික හෝ වෘත්තියමය සුදුසුකම් දරන තැනැත්තන් අතුරින් හෝ වෘත්තීය ආයතන හෝ රාජ්‍ය නොවන සංවිධාන නියෝජනය කරන තැනැත්තන් අතුරින් තෝරා ගත් යම් තැනැත්තන්ගෙන් සමන්විත, අවශ්‍ය යයි හෝ සුදුසු යයි තීරණය කරනු ලැබිය හැකි යම් උපදේශක කමිටු කලින් කළ, පිහිටුවනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලැබිය හැකි යම් බලතල, කාර්ය සහ කර්තව්‍ය (1) වන උපවගන්තිය යටතේ පිහිටුවනු ලබන උපදේශක කමිටුවකට පවරනු ලැබිය හැකි වුව ද, එසේ පවරන ලද බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් මණ්ඩලයට අහිමිවීමක් එමගින් සිදු නොවන්නේ ය. උපදේශක කමිටුවක් විසින් ගනු ලබන යම් තීරණයක් සංශෝධනය කිරීමට හෝ ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට මණ්ඩලයට බලය තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද උපදේශක කමිටුවක සාමාජිකයන්ට, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ යම් දීමනාවක්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය හැකි ය.

ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව.

**10**. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුවක් පිහිටුවනු ලැබිය යුතු ය :—

(අ) 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත යටතේ පත් කරන ලද, මධ්‍යම පරිසර අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(ආ) (451 වන අධිකාරය වූ) වන සංරක්ෂණ ආඥා පනත යටතේ පත් කරන ලද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ වන සංරක්ෂණ ජනරාල්වරයා ;

(ඇ) (469 වන අධිකාරය වූ) වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත යටතේ පත් කරන ලද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ- ජනරාල්වරයා ;

(ඈ) (453 වන අධිකාරය වූ) වාරිමාර්ග ආඥා පනත යටතේ පත් කරන ලද වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(ඉ) 1979 අංක 23 දරන ශ්‍රී ලංකා මහවැලි අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහවැලි සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(ඊ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩල පනත යටතේ පත් කරන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාන්‍යාධිකාරීවරයා ;

(උ) (464 වන අධිකාරය වූ) ඉඩම් සංවර්ධන ආඥා පනත යටතේ පත් කරන ලද ඉඩම් කොමසාරිස්වරයා ;

(ඌ) 1978 අංක 4 දරන ජාතික රාජ්‍ය සභාවේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනත යටතේ පත් කරන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(එ) 1981අංක 57 දරන වෙරළ සංරක්ෂණ පනත යටතේ පත් කරන ලද වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(ඒ) අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ;

(ඔ) සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයා; සහ

(ඕ) සංවර්ධන ව්‍යාපෘතියක් ක්‍රියාත්මක කරනු ලබන පරිපාලන පළාත සඳහා පිහිටුවනු ලබන පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයා.

(2) අමාත්‍යවරයා විසින් කමිටුවේ සභාපතිවරයා වශයෙන් (1) වන උපවගන්තියේ (ඔ) ඡේදයේ සඳහන් කරන ලද සාමාජිකයා හැර, කමිටුවේ සාමාජිකයන් අතරින් එක් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(3) අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා කමිටුවේ සියලු රැස්වීම්වල කැඳවුම්කරු ලෙස ක්‍රියා කළ යුතු ය.

11. කමිටුවේ කර්තව්‍ය විය යුත්තේ :— කමිටුවේ කර්තව්‍ය.

(අ) මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘති සම්බන්ධයෙන් තාවකාලික අනුමතය සහ අවසාන අනුමතය ප්‍රදානය කිරීමේ දී, කමිටුවේ පිළිගැනීම සඳහා වූ තාක්ෂණික, පාරිසරික සහ ආර්ථික මාර්ගෝපදේශ සකස් කිරීම පිළිබඳව මණ්ඩලයට උපදෙස් දීම ;

(ආ) මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ හේතුවෙන් පැන නැගිය හැකි යයි අනුමාන කල හැකි පාරිසරික උවදුරු සහ වෙනත් විපාක ඇගයීම සහ තක්සේරු කිරීම ;

(ඇ) මධ්‍යම ජාලය තුළ වූ බලශක්ති ව්‍යාපෘතියක් සඳහා අවසාන අනුමතයක් ප්‍රදානය කල විටක දී හෝ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක් සඳහා අනුමතය ප්‍රදානය කළ විටක දී ඇති වන යම් පාරිසරික උවදුරු,

තාක්ෂණික සහ වෙනත් සමාජ- ආර්ථික විපාක අවම කිරීමේ පියවර ලෙස ඉල්ලුම්කරුවකු විසින් සම්පූර්ණ කළ යුතු කොන්දේසි පැනවීම ;

(ඇ) මධ්‍යම ජාලය තුළ වූ බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා කරන ලද ඉල්ලීම් වෙනුවෙන් තාවකාලික අනුමතය සහ අවසාන අනුමතය ප්‍රදානය කිරීම සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘති සඳහා අනුමතය ප්‍රදානය කිරීම ;

(ඉ) ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵලයක් ලෙස ඇති විය හැකි යම් පාරිසරික උවදුරු සහ වෙනත් සමාජ - ආර්ථික විපාක වැළැක්වීමේ අරමුණින්, මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති ක්‍රියාත්මක වීම නිරීක්ෂණය කිරීම සහ අධීක්ෂණය කිරීම ; සහ

(ඊ) ක්‍රියාත්මකව පවතින නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රතිපත්ති, නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සැලසුම් සහ නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධන උපාය මාර්ග, කලින් කළ විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ අවශ්‍ය අවස්ථාවල දී එම ප්‍රතිපත්ති, සැලසුම් සහ උපාය මාර්ග පිළිබඳව වෙනස් කිරීම් මණ්ඩලයට නිර්දේශ කිරීම.

## IV වන කොටස

## බලශක්ති සංවර්ධන ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම

බලශක්ති සංවර්ධන ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීම.

**12.** (1) අමාත්‍යවරයා විසින් (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව සහ යම් ප්‍රදේශයක් නැවත බලගැන්විය හැකි බලශක්ති සංරක්ෂණය සහ කළමනාකරණය සඳහා සුදුසු හෝ බලශක්ති සංවර්ධන ව්‍යාපෘති ප්‍රවර්ධනය කිරීම සඳහා සුදුසු බවට මණ්ඩලය විසින් කරන ලද නිර්දේශ සැලකිල්ලට ගනිමින්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් (මේ පනතේ "සංවර්ධන ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලබන) එම ප්‍රදේශය බලශක්ති සංවර්ධන ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් (1) වන උපවගන්තිය යටතේ යම් ප්‍රදේශයක් සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට පෙරාතුව, ඒ ප්‍රදේශය සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමේ දී

විමසා බැලීම අවශ්‍ය යයි හෝ සුදුසු යයි ඔහු විසින් තීරණය කරනු ලබන යම් අමාත්‍යවරයකු හෝ අමාත්‍යවරුන් හෝ යම් පළාත් සභා අමාත්‍යවරයකු විමසා බැලීම කළ යුතු ය.

(3) යම් ප්‍රදේශයක් සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරමින් (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන නියමයක, ඒ ප්‍රදේශයේ මායිම් සහ ඉම් ලකුණු දක්වමින් ඒ ප්‍රදේශය නිරූපනය කොට දක්වා තිබිය යුතු ය.

සංවර්ධන ප්‍රදේශයක් තුළ පිහිටි නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සංරක්ෂණය කිරීම සඳහා අධිකාරිය වගකිව යුතු බව.

**13**. සංවර්ධන ප්‍රදේශයක් තුල පිහිටි නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සියල්ල සංරක්ෂණය කිරීම සහ කළමනාකරණය කිරීම පිළිබඳ අධිකාරිය වගකිව යුතු අතර, ඒ සම්පත්වලින් උපරිම ආර්ථික උපයෝගිතාවක් ලබා ගැනීමේ අරමුණින් ඒ බලශක්ති සම්පත් ප්‍රවර්ධනය කිරීම සහ සංවර්ධන කිරීම සඳහා අවශ්‍ය සියලු පියවර ගැනීම ද කළ යුතු ය.

අයිතිකරුට හෝ පදිංචිකරුට ඇතැම් ක්‍රියාවන් සිදු කිරීම තහනම් බව.

**14**. යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සංවර්ධන ප්‍රදේශයක් තුල පිහිටා ඇති යම් ඉඩමක අයිතිකරුවකු හෝ පදිංචිකරුවකු විසින් අධිකාරියේ ලිඛිත අනුමතයකින් තොරව සහ අධිකාරිය විසින් අදාල කාර්ය සඳහා පනවනු ලැබිය හැකි නියම සහ කොන්දේසිවලට යටත්ව හැර, ඒ සංවර්ධන ප්‍රදේශය තුළ පිහිටා ඇති නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පතක ස්වරූපය වෙනස් කරනු ලැබිය හැකි සහ එවැනි යම් සම්පතක සංවර්ධනය කිරීමේ ආර්ථික ශක්‍යතාව බොහෝ දුරට අඩු කරන ආකාරයට හෝ ඒ තාක් දුරට එම සම්පතෙහි ක්ෂයවීම සිදු කරනු ලැබිය හැකි කිසියම් ක්‍රියාවක් සිදු කිරීම නොකළ යුතු අතර, වෙනත් යම් තැනැත්තකුට එවැනි කිසියම් ක්‍රියාවක් සිදු කිරීමට ද, අවසර නොදිය යුතු ය.

සංවර්ධන ප්‍රදේශයක් තුළ ඇති නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත්වල අයිතිය ජනරජයට ඇති බව.

**15**. (1) මෙහි මින්මතු සළසා ඇති විධිවිධානවලට සහ 18 වන වගන්තිය හෝ 25 වන වගන්තිය යටතේ නිකුත් කරනු ලැබූ බලපත්‍රයක් මගින් කිසියම් තැනැත්තකුට ප්‍රදානය කළ අයිතිවාසිකම්වලට යටත්ව, සංවර්ධන ප්‍රදේශයක් තුළ වූ භූමිය මතුපිට හෝ එහි අභ්‍යන්තරයෙහි හෝ එම භූමිය ඉහලින් වූ ගුවන් අවකාශයෙහි හෝ ඇති නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සියල්ලක ම පරම අයිතිය, යම් තැනැත්තකුට ඒ ප්‍රදේශය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් දරනු ලැබීමට අයිතියක් හෝ අන්‍යාකාරයකින් ඒ සඳහා යම් අයිතිවාසිකමක් තිබුන ද, මේ මගින් ජනරජයට පවරනු ලැබේ.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, ඒ උපවගන්තියේ විධිවිධාන ප්‍රකාර යම් භූමියක මතුපිට හෝ එහි අභ්‍යන්තරයෙහි හෝ එම භූමිය ඉහලින් වූ අවකාශයෙහි ඇති නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පතක අයිතිය හෝ අන්‍යාකාරයකින් ඒ සඳහා වන අයිතිවාසිකමක් අහිමි වන යම් තැනැත්තකු, මේ පනතේ 9 වන වගන්තිය යටතේ තත් කාර්ය සඳහා මණ්ඩලය විසින් පත් කරනු ලබන උපදේශක කමිටුවක් මගින් තීරණය කරනු ලැබිය හැකි වන්දියක් ගෙවනු ලැබීමකට හිමිකම් දැරිය යුතු ය. මේ උපවගන්තිය යටතේ ගෙවනු ලබන වන්දි ප්‍රමාණය ගණනය කිරීමේ දී ඒ උපදේශක කමිටුව විසින් අදාළ තැනැත්තාට කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ලබා දිය යුතු ය.

මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති.

**16**. (1) වෙනත් යම් නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, 71 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, සංවර්ධන ප්‍රදේශයක් තුළ සහ තත්කාර්ය සඳහා අධිකාරිය විසින් නිකුත් කරන ලද බලපත්‍රයකින් වූ අධිකාරි බලය යටතේ හැර, කිසිදු තැනැත්තකු විසින් බලය ජනනය කිරීම සහ සැපයීම සඳහා ක්‍රියාත්මක වන මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක නිරතවෙමින් එවැන්නක් කරගෙන යාම නොකළ යුතු ය.

(2) සංවර්ධන ප්‍රදේශයක් තුළ මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක නිරතවෙමින් එවැන්නක් කරගෙන යාම අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින්, නියමිත ගාස්තුව සහ පහත දැක්වෙන ලේඛන ඇතුළුව ඒ සඳහා වූ නියමිත ආකෘති පත්‍රයකින්, අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය :—

(අ) යෝජිත ව්‍යාපෘතියේ භූගෝලීය පිහිටීම පිළිබඳ වූ සිතියමේ පිටපතක් ;

(ආ) ජනනය කළ හැකි බල ශක්ති ප්‍රමාණය ඇතුළුව ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක් ;

(ඇ) යොදාගන්නා ලද ප්‍රශස්තකරණ උපමානය ඇතුළු මූල්‍ය සැලසුම සහ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ;

(ඈ) ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ඇති බවට සාධක හෝ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කරන මුදල් ලබාගන්නා ආකාරය ;

(ඉ) ව්‍යාපෘතියේ පිහිටීම (එය ජලවිදුලි ව්‍යාපෘතියක් වේ නම්, ගංගාවට හෝ දිය පහරට අදාළව ජාකොටුව සහ බලාගාරය, එය සුළං බල ව්‍යාපෘතියක් වේ නම්, සුළං තලබමන සහ ව්‍යුහයන්, එය ජෛව ස්කන්ධ ව්‍යාපෘතියක් මේ නම් ඉන්ධන වගාව, බලාගාරය සහ ජල මූලාශ්‍රය සහ එය වෙනත් යම් ව්‍යාපෘතියක් වේ නම්, බලශක්ති මූලාශ්‍රයට අදාළව පරිවර්තනය කිරීමේ නිමාවන්) ; සහ

(ඊ) ජනනය කරන ලද විදුලිබලය මුදාහැරීමට ඉල්ලුම්කරු අපේක්ෂා කරන්නේ කෙසේද යන්නත්, ජාතික විදුලිබල ජාලයට ජනක යන්ත්‍රය සම්බන්ධ කරනු ලබන ස්ථානය සහ මේ කාර්යය සඳහා අදින විදුලි රැහැන් මාර්ගය සම්බන්ධ භූගෝලීය ප්‍රදේශය පිළිබඳව ද පැහැදිලි කරමින් වූ ප්‍රකාශයක්.

(3) (2) වන උපවගන්තිය යටතේ ඉල්ලුම්පත්‍රයක් ලැබුන කළ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නොපමාව එම ඉල්ලුම් පත්‍රය සහ ඒ සමග වූ ලේඛන ඒ කාර්යය සඳහා පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයක ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, එම ඉල්ලුම්කරුට ලියාපදිංචි කිරීමේ අංකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

තාවකාලික අනුමතය ප්‍රදානය කිරීම.

17. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඔහු විසින් අවශ්‍ය යයි තීරණය කරනු ලබන යෝජිත ව්‍යාපෘතියේ මූලික කටයුතු ආවරණය කරගෙන යාමෙන් අනතුරුව, ශ්‍රී ලංකා විදුලිබල මණ්ඩලය ද විමසා යෝජිත ව්‍යාපෘතිය පිළිබඳ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිරීක්ෂණයන් ද සමගින් ලියාපදිංචි ඉල්ලුම්පත්‍රය කමිටුවේ අනුමතය සඳහා කමිටුවට භාර දෙනු ලැබිය යුතු ය.

(2) සුදුසු යයි කමිටුව තීරණය කරන අවස්ථාවක දී, කමිටුව විසින් :—

(අ) ව්‍යාපෘතිය සඳහා තාවකාලික අනුමතය ප්‍රදානය කර, ඒ බව නොපමාව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නියමිත ආකාරයෙන් ඉල්ලුම්කරුට දැනුම් දෙනු ලැබිය යුතු ය. ඉල්ලුම්කරු වෙත ඒ දැනුම්දීම කරනු ලැබීමෙන් මාස හයක් ඇතුළත තත් කාර්යය සඳහා නියම කරනු ලබන යම් ලේඛන සහ වෙනත් තොරතුරු භාර දෙන ලෙසට වූ ඉල්ලීමක් ද, ඒ සමග යැවිය යුතු ය ; නැතහොත්

(ආ) ව්‍යාපෘතිය සඳහා තාවකාලික අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කර, ඒ බව නොපමාව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ඒ ප්‍රතික්ෂේප කිරීමට හේතු ද දක්වමින්, ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ වූ ලේඛන සහ තොරතුරු භාරදීම සඳහා දෙන ලද කාලය දීර්ඝ කරන ලෙස ඉල්ලා සිටි අවස්ථාවක දී, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් තවත් මාස හයක් සඳහා වූ උපරිම කාලයක් දක්වා දීර්ඝ කිරීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ප්‍රදානය කරන ලද තාවකාලික අනුමතයක්, ඒ අනුමතය ප්‍රදානය කරන දිනයේ සිට එක් අවුරුද්දක කාලයක් සඳහා වලංගු විය යුතු අතර, ඒ එක් අවුරුදු කාලය ඉකුත් වීමට පෙරාතුව ඉල්ලා සිටි ලේඛන සහ වෙනත් තොරතුරු භාර දී නොමැති නම්, එය නිරායාසයෙන්ම අවලංගු වන්නේ ය.

අවසාන අනුමතය.

**18.** (1) ඉල්ලා සිටින ලද ලේඛන සහ වෙනත් තොරතුරු ලැබීමෙන් අනතුරුව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලියාපදිංචි ඉල්ලුම්පත්‍රය සහ ඔහුගේ නිර්දේශයන් ද සමග ඒ ලේඛන සහ තොරතුරු යෝජිත ව්‍යාපෘතිය වෙනුවෙන් අවසාන අනුමතය ප්‍රදානය කිරීම සළකා බැලීම පිණිස, කමිටුව වෙත නොපමාව ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් එවන ලද ලේඛන සහ තොරතුරු ලැබී මාසයකට නොඅඩු කාලයක් තුළ දී, කමිටුව විසින් :—

(අ) ඉල්ලුම්පත්‍රය අනුමත කරමින් සහ නියමිත ආකාරයෙන් සහ නියම කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව බලපත්‍රයක් නිකුත් කිරීමට කමිටුවේ අනුමතය ලබා දී ඇති බවට ඉල්ලුම්කරු වෙත නොපමාව දැනුම් දෙන ලෙසට අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරමින් ; නැතහොත්

(ආ) ඉල්ලුම්පත්‍රය අනුමත කිරීම ප්‍රතික්ෂේප කර ඒ සඳහා හේතු දක්වමින් ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව ඉල්ලුම්කරු වෙත නොපමාව දැනුම් දෙන ලෙසට අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරමින්,

ඒ සම්බන්ධයෙන් තීරණයක් ගැනීම කමිටුවේ කාර්යය විය යුතු ය.

(3) කමිටුව විසින් (2) වන උපවගන්තිය යටතේ ස්වකීය තීරණයට එළඹීම සඳහා වූ හේතු 16 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන රෙජිස්ටරයෙහි සටහන් කරනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ ඉල්ලුම්පත්‍රයක් අනුමත කිරීමෙන් පසුව නිකුත් කරනු ලබන බලපත්‍රයක්, වසර විස්සක කාලයක් සඳහා වලංගුවිය යුතු ය. එසේ වුව ද, ඒ බලපත්‍රය නිකුත් කිරීමෙන් වසර දෙකක කාලයක් තුළ දී සංවර්ධනකරු විසින් ව්‍යාපෘතිය පටන් ගැනීම සහ විදුලිය ජනනය කිරීම ආරම්භ කිරීම සිදු කල යුතු ය.

(5) වසර විස්සක කාලය අවසානයේ දී මණ්ඩලය විසින් සංවර්ධනකරුගේ ඉල්ලීම පරිදි කමිටුව විමසා බලපත්‍රයේ වලංගු කාලය තවදුරටත් වසර විස්සකට නොවැඩි කාලයකින් දීර්ඝ කරනු ලැබිය හැකි ය.

රාජ්‍ය භාගය ගෙවීම.

**19**. (1) සංවර්ධනකරු විසින් නිකුත් කරන ලද බලපත්‍රය ක්‍රියාත්මකව පවතින්නේ කවර කාලයක් තුළදී ද, එම කාලය තුළදී, ව්‍යාපෘතිය සඳහා භාවිතා කරනු ලබන නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් වෙනුවෙන් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් ගාස්තුවක්, රාජ්‍ය භාගය ලෙස වාර්ෂිකව අධිකාරියට ගෙවීමට බැඳී සිටිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ගාස්තුවක් ලෙස ගෙවන ලද සියලු මුදල්, අධිකාරිය විසින් 46 වන වගන්තිය යටතේ පිහිටුවන ලද බලශක්ති අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

අලාභ ගෙවීමට හෝ දරන ලද යම් වියදමක පිරිවැය දැරීමට අධිකාරිය බැඳී නොසිටින බව.

**20**. (අ) 17 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කමිටුව විසින් ව්‍යාපෘතියක් සඳහා තාවකාලික අනුමතය ලබාදීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී ;

(ආ) 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ කමිටුව විසින් ව්‍යාපෘතිය සඳහා අවසාන අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී ; හෝ

(ඇ) 21 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කරනු ලබන අවස්ථාවක දී,

17 වන වගන්තියේ (2) වන උපවගන්ති යටතේ ඉල්ලා සිටින ලද ලේඛන සහ වෙනත් තොරතුරු සැපයීමේ දී, අවස්ථාවෝචිත පරිදි, ඉල්ලුම්කරු හෝ සංවර්ධනකරු විසින් දරන ලද යම් වියදමක් ප්‍රතිපූරණය කිරීමට හෝ යම් අලාභයක් ගෙවීමට හෝ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රය

ප්‍රදානය කිරීමෙන් පසුව ආරම්භ කරන ලද ව්‍යාපෘතියෙහි වැඩ කිසිවක් වෙනුවෙන් සංවර්ධනකරු විසින් දරන ලද යම් වියදමක් හෝ ගෙවීමට, අධිකාරිය යටත් නොවන්නේ ය.

බලපත්‍රයක් අවලංගු කිරීම.

**21**. (1) 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, සංවර්ධනකරු විසින් :—

(අ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යාපෘතිය පටන්ගැනීමට සහ බලය ජනනය කිරීම ආරම්භ කිරීමට ඒ බලපත්‍රය නිකුත් කිරීමෙන් වසර දෙකක කාලයක් තුළ දී අපොහොසත් වන අවස්ථාවක දී ; හෝ

(ආ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් නියම සහ කොන්දේසිවලට යටත්ව ද, එම නියම සහ කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කරන හෝ ඒවාට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී,

මණ්ඩලයේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් අවලංගු කරනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලය විසින්, නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම අනුමත කිරීමට පෙරාතුව, ඒ බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් කරුණු දැක්වීමට සංවර්ධනකරුට අවස්ථාවක් ප්‍රදානය කරනු ලැබිය යුතු අතර, එය විසින් සුදුසු යයි සහ සාධාරණ යයි තීරණය කරනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රය අවලංගු කිරීම යෝජනා කිරීමට තුඩුදුන් බලපත්‍රයේ යම් අවශ්‍යතාවයකට හෝ යම් නියම හෝ කොන්දේසිවලට අනුකූලවීමට හෝ යම් නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කිරීමෙන් වැළකී සිටීමට අවශ්‍ය කාලයක්, මණ්ඩලය විසින් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමට හෝ බලපත්‍රයක් අවලංගු කිරීමට එරෙහිව අභියාචන.

**22**. (1) යම් තැනැත්තකු :—

(අ) ඉල්ලීමක් සඳහා තාවකාලික අනුමතය ප්‍රදානය කිරීම ප්‍රතික්ෂේප කිරීමෙන් ;

(ආ) ඉල්ලීමක් වෙනුවෙන් අවසාන අනුමතය ප්‍රදානය කිරීම ප්‍රක්ෂේප කිරීමෙන් ; හෝ

(ඇ) 21 වන වගන්තිය යටතේ බලපත්‍රයක් අවලංගු කිරීමෙන්,

අතෘප්තියට පත් වන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව හෝ අවලංගු වන දිනය පිළිබඳ තමාට දැනුම් දීම එම තැනැත්තාට ලැබීමෙන් මාසයක කාලයක් ඇතුළත, ඒ ප්‍රතික්ෂේප කිරීමට හෝ අවලංගු කිරීමට එරෙහිව ඒ තැනැත්තා විසින් මණ්ඩලය වෙත අභියාචනයක් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් තීරණයකට එළඹීමට පෙරාතුව, 9 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා පිහිටුවන ලද උපදේශක කමිටුවක උපදෙස් සහ නිරීක්ෂණ ලබා ගත හැකි ය.

(3) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය වෙත කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට එරෙහිව, එම තැනැත්තාට ඒ තීරණය දැනුම් දෙනු ලැබූ දිනයේ සිට දින දාහතරක් ඇතුළත, අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ යම් අභියාචනයකට අදාලව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදන ලද රීති, මේ වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කරන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කර ගනු ලැබිය යුතු ය.

මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘති.

**23**. (1) වෙනත් යම් නීතියක විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, කිසිම තැනැත්තකු විසින් අධිකාරිය විසින් තත්කාර්ය සඳහා නිකුත් කරන ලද බලපත්‍රයක් යටතේ වූ බලයක් යටතේ හැර, බලය ජනනය කිරීම සහ සැපයීම සඳහා මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘතියක නිරත වෙමින් එවැන්නක් කරගෙන යාම නොකළ යුතු ය.

(2) මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘතියක නිරතවෙමින් එවැන්නක් කරගෙන යාමට අපේක්ෂා කරන යම් තැනැත්තකු විසින් නියමිත ගාස්තුව සහ පහත දැක්වෙන ලේඛන ද ඇතුළුව ඒ සඳහා වූ නියමිත ආකෘති පත්‍රයකින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කරනු ලැබිය යුතු ය :—

(අ) යෝජිත ව්‍යාපෘතියේ භූගෝලීය පිහිටීම පිළිබඳ වූ සිතියමක පිටපතක් ;

(ආ) ජනනය කළ හැකි බලශක්ති ප්‍රමාණය සහ එහි ඇස්තමේන්තු කරන ලද මුළු පිරිවැය ඇතුළුව ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක් ;

(ඇ) යොදාගන්නා ලද ප්‍රශස්තකරණ උපමානය ඇතුළුව මූල්‍ය සැළසුම සහ ඇස්තමේන්තුගත මුළු පිරිවැය ;

(ඈ) ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ඇති බවට සාධක හෝ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කරන මුදල් ලබාගන්නා ආකාරය ;

(ඉ) ව්‍යාපෘතියේ පිහිටීම, (එය ජල විදුලි ව්‍යාපෘතියක් වේ නම්,ගංගාවට හෝ දිය පහරට අදාළව ජාකොටුව සහ බලාගාරය, එය සුළං බල ව්‍යාපෘතියක් වේ නම්, සුළං තලබමන සහ ව්‍යුහයන්, එය ජෛව ස්කන්ධ ව්‍යාපෘතියක් වේ නම් ඉන්ධන වගාව, බලාගාරය සහ ජල මූලාශ්‍රය සහ එය වෙනත් යම් ව්‍යාපෘතියක් වේ නම්, බලශක්ති මූලාශ්‍රයට අදාළව පරිවර්තනය කිරීමේ නිමාවන්) ;

(ඊ) පහත දැක්වෙන තොරතුරු සමගින් වූ ව්‍යාපෘතිය පිළිබඳ තොරතුරු ඇතුළත් ශක්‍යතා අධ්‍යයන වාර්තාවක් :—

(i) ව්‍යාපෘතිය හා සම්බන්ධ විස්තරාත්මක ඉංජිනේරු සැළැස්මක් ;

(ii) ඒ ව්‍යාපෘතියෙන් ප්‍රතිලාභ ලබන තැනැත්තන් පිළිබඳ සමාජ ආර්ථික සමීක්ෂණයක් ;

(iii) ව්‍යාපෘතියෙන් ඇතිවිය හැකි පාරිසරිකමය ප්‍රතිඵලවලට අදාළව 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත මගින් පිහිටුවන ලද මධ්‍යම පරිසර අධිකාරියෙන් වාර්තාවක් ; සහ

(iv) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය සම්බන්ධයෙන් වූ කාල නිශ්චිත ක්‍රියාකාරී සැළැස්මක් ;

(උ) බලශක්තිය බලශක්ති විෂයය භාර පළාත් බලශක්ති අමාත්‍යාංශයේ “මධ්‍යම ජාලයෙන් බැහැර පාරිභෝගිකයන්ගේ සමිතියක්” වශයෙන් ලියාපදිංචි වීමේ කාර්යය සඳහා, ව්‍යාපෘතියේ බලාපොරොත්තු විය හැකි අර්ථලාභීන් විසින් ඉදිරිපත් කරන ලද එක් එක් ඉල්ලුම්පත්‍රයේ පිටපතක් ;

(ඍ) 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත යටතේ විදුලිබලය උත්පාදනය කිරීමේ බලපත්‍රයක් ලබාගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබූ බවට ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමයේ පිටපතක් ;

(එ) (අ) ඡේදයේ සඳහන් කරන ලද භූගෝලීය පිහිටීම ඇතුළත එකී පාරිභෝගිකයන් වාසය කරන පරිශ්‍රයන්ට, උත්පාදනය කරන ලද විදුලි බලය බෙදාහැරීම සඳහා 2002 අංක 28 දරන විදුලිබල ප්‍රතිසංස්කරණ පනත යටතේ බෙදාහැරීමේ බලපත්‍රයක් ලබා ගැනීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක් ප්‍රදානය කරනු ලැබූ බවට ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයේ පිටපතක් ;

(ඒ) ඉල්ලුම්කරු විසින් ජනනය කරන ලද බල ශක්තිය බෙදාහැරීමට අපේක්ෂා කරන්නේ කෙසේ ද යන්න පැහැදිලි කරන ප්‍රකාශයක් සහ ඒ ඉල්ලුම්කරුගෙන් බල සැපයුම ලබා ගැනීමට කැමැත්ත දක්වා ඇති යම් පාරිභෝගිකයන්ගේ නම් සහ ඒ පාරිභෝගිකයන් වාසය කරන අදාළ පරිශ්‍ර පිහිටි භූගෝලීය ප්‍රදේශවලට අදාළව ඒ පරිශ්‍රයන් වෙත ජනනය කරන ලද විදුලිබලය ගෙන යාම සඳහා වූ බෙදාහැරීමේ පද්ධතිය පිළිබඳ විධිමත් සටහනක් ; සහ

(ඔ) කමිටුව විසින් නියම කරනු ලැබිය හැකි වෙනත් යම් තොරතුරු .

(3) (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන ඉල්ලීමක් ලැබීමෙන් අනතුරුව, අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් නොපමාව ඒ හා සමග ලැබුනු ලේඛන සමග එම ඉල්ලුම් පත්‍රය ඒ කාර්යය සඳහා පවත්වාගෙන යන රෙජිස්ටරයක ලියාපදිංචි කරනු ලැබිය යුතු අතර, ඉල්ලුම්කරුට ලියාපදිංචි කිරීමේ අංකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

**24.** (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, 23 වන වගන්තියේ (3) උපවගන්තිය යටතේ වූ ඉල්ලීමක් ලියාපදිංචි කිරීමෙන් දින තිහක් ඇතුළත:—

මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති සඳහා අදාළ එකහත්වය සහ සහතික කිරීම ලබාගැනීම සඳහා වූ ක්‍රියා පටිපාටිය.

(අ) අදාළ ප්‍රාදේශීය අමාත්‍යාංශයේ සහ ඒ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්වරයාගේ එකහත්වය ලබා ගැනීම ; සහ

(ආ) ව්‍යාපෘතිය පිළිබඳ යම් මූලික පිරික්සුමක් කිරීම සහ විශේෂ ස්ථාන සඳහා ඉදිරි අවුරුදු පහක කාලයක් සඳහා විදුලි බලය ව්‍යාප්ත කිරීමට සැලසුම් කර නැති බවට ප්‍රදේශය තුල බලය බෙදා හැරීම පිළිබඳ වගකීමක් ඇති අස්ථිත්වයෙන් තහවුරු කිරීමක් ලබා ගැනීම,

කළ යුතු ය.

(2) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් (1) වන උපවගන්තිය යටතේ ඔහු විසින් ලබා ගන්නා ලද එකඟත්වය සහ තහවුරු කිරීම හා ඉදිකිරීම සඳහා අවශ්‍ය වැඩබිමක් තිබීම පිළිබඳව ව්‍යාපෘතියේ තාක්ෂණික අංග සහ තාක්ෂණ සහ ඉල්ලුම්කරුගේ මූල්‍යමය හැකියාව පිළිබඳව ද ඔහු කරන ලද නිරීක්ෂණ සමග, ඉල්ලුම්පත්‍රය කමිටුවේ සලකා බැලීම සඳහා කමිටුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(3) කමිටුව විසින් (2) වන උපවගන්තිය යටතේ එයට ඉදිරිපත් කරන ලද ඉල්ලීමක් පිළිබඳව හැකිතාක් ඉක්මණින්, එහෙත් ඒ ඉල්ලීම ලැබුණු දිනයෙන් දින තිහකට නොවැඩි කාලයක් තුළ දී තීරණයක් දිය යුතු අතර, එම තීරණයට තුඩු දුන් හේතු දක්වමින් ඒ තීරණය පිළිබඳ අධ්‍යක්ෂ-ජනරාල්වරයාට දැනුම් දිය යුතු ය. අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 23 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ පවත්වාගෙන යන රෙජිස්ටරයක කමිටුවේ තීරණය පිළිබඳව සටහන් කර තැබිය යුතු ය.

කමිටුවේ තීරණය ඉල්ලුම්කරුට දැනුම් දිය යුතු බව.

**25**. 24 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ කමිටුව විසින් දෙන ලද තීරණය ලැබීමෙන් අනතුරුව අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් :—

(අ) කමිටුව විසින් ඉල්ලීම අනුමත කරන අවස්ථාවක දී, නියමිත ආකෘතියකින් වූ බලපත්‍රයක්, නියම කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව නොපමාව ඉල්ලුම්කරු වෙත නිකුත් කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) කමිටුව විසින් ඉල්ලීම අනුමත කර නොමැති අවස්ථාවක දී, ඒ ප්‍රතික්ෂේප කිරීම හා එසේ කිරීමට තුඩු දුන් හේතු දක්වමින් නොපමාව ඉල්ලුම්කරු වෙත දැනුම් දිය යුතු ය.

බලපත්‍රය වලංගු කාලය සහ ගෙවිය යුතු ගාස්තු.

**26**. (1) ඉල්ලීමක් අනුමත වීම මත, මේ පනතේ 25 වන වගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරනු ලබන බලපත්‍රයක වලංගු කාලය, ව්‍යාපෘතියේ ස්වභාවය සහ ජනනය කරනු ලබන බලයේ ධාරිතාවය පිළිබඳ සැලකිල්ලට ගනිමින් නියම කරනු ලැබිය යුතු ය.

(2) මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ගාස්තුවක්, නිකුත් කරන ලද බලපත්‍රයේ වලංගු කාලය තුළ දී බලපත්‍රය දරන්නාට වාර්ෂිකව ගෙවනු ලැබීමට නියම කරනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ගාස්තුවක් ලෙස ගෙවන ලද මුදල් සියල්ල, අධිකාරිය විසින් 46 වන වගන්තිය යටතේ පිහිටුවන ලද බලශක්ති අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

**27**. (1) 25 වන වගන්තියේ (අ) ඡේදය යටතේ නිකුත් කරන ලද බලපත්‍රයක්, බලපත්‍රය දරන්නා විසින් — බලපත්‍රයක් අවලංගු කිරීම.

(අ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් ද, ඒ ව්‍යාපෘතිය ආරම්භ කිරීමට සහ ඒ බලපත්‍රය නිකුත් කර වසර දෙකක කාලයක් තුළ දී බලය ජනනය කිරීම ආරම්භ කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී ; හෝ

(ආ) ඒ බලපත්‍රය නිකුත් කරනු ලැබුවේ යම් නියම හෝ කොන්දේසිවලට යටත්ව ද, ඒ නියම හෝ කොන්දේසි උල්ලංඝනය කරමින් කටයුතු කරන හෝ ඒවාට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක,

මණ්ඩලයේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඒ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලය විසින් නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීම අනුමත කිරීමට පෙරාතුව, ඒ බලපත්‍රය අවලංගු නොකළ යුත්තේ මන්ද යන්න සම්බන්ධයෙන් හේතු දැක්වීමට බලපත්‍රය දරන්නාට අවස්ථාවක් ප්‍රදානය කරනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් සුදුසු සහ සාධාරණ යයි තීරණය කරනු ලබන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, බලපත්‍රයේ යම් අවශ්‍යතාවයන්ට හෝ යම් නියම හෝ කොන්දේසිවලට අනුකූලවීමට හෝ බලපත්‍රය අවලංගු කිරීමට යෝජනා කිරීම සඳහා පැන නැගී ඇති යම් නියම හෝ කොන්දේසි උල්ලංඝනය කර කටයුතු කිරීමෙන් වැළකීමට, අවශ්‍ය කාලයක් ප්‍රදානය කරනු ලැබිය හැකි ය.

**28**. (1) යම් තැනැත්තකු :— බලපත්‍රයක් ප්‍රතික්ෂේප කිරීම හෝ අවලංගු කිරීමට එරෙහිව අභියාචනා.

(අ) මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක් සඳහා කමිටුව විසින් බලපත්‍රයක් නිකුත් කිරීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් ; හෝ

(ආ) නිකුත් කරන ලද බලපත්‍රයක් 27 වන වගන්තිය යටතේ අවලංගු කිරීම හේතුවෙන්,

අතෘප්තියට පත් වේ නම්, ඒ තැනැත්තා විසින් ඒ තීරණයට එරෙහිව මණ්ඩලය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් අභියාචනයකට මණ්ඩලය විසින් දෙන ලද තීරණයකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් ඒ තීරණයට එරෙහිව අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි අතර, ඒ පිළිබඳ ඔහුගේ තීරණය අවසාන තීරණය විය යුතු ය.

සංවර්ධනකරු හෝ බලපත්‍ර දරන්නකු නිසි උද්‍යෝගයෙන් කටයුතු කළ යුතු බව.

**29**. (1) ව්‍යාපෘතිය සඳහා භාවිත කරනු ලබන නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් නිසි උද්‍යෝගයෙන් සහ දැඩි සැලකිල්ලෙන් යුතුව භාවිත කිරීමට අවශ්‍ය සියලු පියවර ගැනීම මේ පනතේ මේ කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සෑම සංවර්ධනකරුවකුගේම හෝ සෑම බලපත්‍රදරන්නකුගේ ම කාර්යය විය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, සංවර්ධනකරුවකුගේ හෝ බලපත්‍ර දරන්නකුගේ නොසැලකිලිමත්භාවය හෝ නිසි උද්‍යෝගය අඩු වීම හේතුවෙන් යම් ව්‍යාපෘතියක් සඳහා භාවිත කරන නැවත බලගැන්වි ය හැකි බලශක්ති සම්පතකට යම් අලාභ හානියක් සිදුවන අවස්ථාවක දී, ඒ සංවර්ධනකරු හෝ බලපත්‍ර දරන්නා විසින්, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදලක්, වන්දි මුදලක් ලෙස අධිකාරියට ගෙවීමට යටත් විය යුතු ය.

## VI වන කොටස

## ව්‍යාපෘති සඳහා නිශ්චල දේපළ අත්පත් කර ගැනීම සහ බද්දට දීම

ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ අධිකාරිය සඳහා ඉඩම් අනිවාර්යයෙන් අත්කර ගැනීම.

**30**. (1) 12 වන වගන්තිය යටතේ සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත්කර ඇති ප්‍රදේශයක් තුළ පිහිටා ඇති යම් ඉඩමක් හෝ ඉඩමකට ඇති යම් සම්බන්ධතාවයක් අධිකාරියේ යම් කාර්යයක් සඳහා අධිකාරියට අවශ්‍ය කරන අවස්ථාවක දී,(460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනතේ කාර්ය සඳහා ඒ කාර්ය පොදු කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ඉඩම හෝ එයට ඇති සම්බන්ධතාවය අධිකාරිය වෙනුවෙන් රජය විසින් ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ

අත්කර ගනු ලැබිය හැකි ය ; තව ද, ඒ පනතේ විධිවිධාන, මේ වගන්තියේ (2) වන උපවගන්තියේ අන්‍යාකාරයකින් සලසා ඇති විධිවිධාන ආරක්ෂා වන පරිදි ඒ ඉඩම හෝ එයට ඇති සම්බන්ධතාවය අත්කර ගැනීමේ කාර්යය සඳහා අදාළ කරගනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ වූ යම් අත්කර ගැනීමක් සම්බන්ධයෙන් ඉඩම් අත්කරගැනීමේ පනත මගින් නියමකර ඇති පරිදි ඒ ඉඩම හෝ ඉඩමේ සම්බන්ධතාවය අත්කර ගැනීමට බලාපොරොත්තු වන බවට වූ ප්‍රසිද්ධ දැන්වීමක්, යම් ප්‍රදේශයක් සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනයෙන් ආරම්භ වන අවුරුදු පහක කාලයක් ඇතුළත වූ යම් කාලයක දී ප්‍රසිද්ධියට පත් කරන අවස්ථාවක දී, ඒ ඉඩම හෝ ඉඩමකට ඇති සම්බන්ධතාවය වෙනුවෙන් ගෙවිය යුතු වන්දි මුදල් ප්‍රමාණය තීරණය කිරීමේ කාර්යය සඳහා ඒ ඉඩමේ හෝ එයට ඇති සම්බන්ධතාවයේ වෙළෙඳ පොළ විකුණුම් වටිනාකම, ඉඩම් අත්කරගැනීමේ පනතෙහි පටහැනිව කුමක් සඳහන් වුව ද, ඒ ප්‍රදේශය සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලැබූ දිනයේ දී ඒ ඉඩම හෝ ඉඩමට ඇති සම්බන්ධතාවය වෙනුවෙන් තිබිය හැකි ව තිබූ වෙළෙඳ පොළ විකුණුම් වටිනාකම සහ—

(අ) යම් ඉඩමක් හෝ ඉඩමකට ඇති සම්බන්ධතාවයක් සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ අතුරු විධානය යටතේ නියමයක් කරනු ලැබ නොමැති විට, ඒ පනතේ 7 වන වගන්තිය යටතේ වූ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ දී ඒ ඉඩම හෝ ඉඩමකට ඇති සම්බන්ධතාවය වෙනුවෙන් පැවති වෙළෙඳ පොළ විකුණුම් වටිනාකම ; හෝ

(ආ) යම් ඉඩමක් හෝ ඉඩමකට ඇති සම්බන්ධතාවය සම්බන්ධයෙන් ඉඩම් අත්කර ගැනීමේ පනතේ 38 වන වගන්තියේ අතුරු විධානය යටතේ නියමයක් කරනු ලැබ ඇති විට දී, ඒ නියමය ගැසට් පත්‍රයේ පළ කරන දිනයේ දී ඒ ඉඩම හෝ ඉඩමකට ඇති සම්බන්ධතාවය වෙනුවෙන් පැවති වෙළෙඳ පොළ විකුණුම් වටිනාකම,

අතර වෙනසේ සියයට පනහක ප්‍රමාණය ලෙස සලකනු ලැබිය යුතු ය.

රජයේ දේපළ අධිකාරියට ලබා දීමට සැලැස්විය යුතු බව.

**31**. අධිකාරියේ යම් කාර්යයක් සඳහා රජයේ යම් නිශ්චල දේපළක් අවශ්‍ය වන අවස්ථාවක, ඒ කාර්යය (454 වන අධිකාරය වූ) රජයේ ඉඩම් ආඥාපනතේ 6 වන වගන්තිය යටතේ විශේෂ ප්‍රදානයක් හෝ බදු දීමක් කළ හැකි කාර්යයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව අධිකාරිය වෙත කරනු ලබන ඒ දේපළෙහි විශේෂ ප්‍රදානයකට හෝ බදු දීමකට ඒ ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

අධිකාරිය විසින් දරන ලද ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවය බද්දට දීම.

**32**. (1) අධිකාරිය විසින් අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මේ පනතේ V වන කොටස යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති යම් ව්‍යාපෘතියක කාර්ය සඳහා අධිකාරිය විසින් දරන ලද යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවයක්, ගෙවිය යුතු බදු කුලිය ද ඇතුළුව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි යම් නියම සහ කොන්දේසිවලට යටත්ව, අවස්ථාවෝචිත පරිදි, සංවර්ධනකරුවකුට හෝ බලපත්‍ර දරන්නකුට බද්දක් ලෙස ප්‍රදානය කරනු ලැබිය හැකි ය. තව ද, විශේෂයෙන් ඒ බදු ගිවිසුමේ නිශ්චිතව සඳහන් කර ඇති යම් නියමයකට හෝ කොන්දේසියකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී හෝ ඒ බදු ගිවිසුම යටතේ අධිකාරියට අයවිය යුතු මුදලක් එහි නිශ්චිතව සඳහන් කරනු ලැබිය හැකි යම් කාලයක් සඳහා නොගෙවා පවතින අවස්ථාවක දී, මේ වගන්තියේ ඉහතින් වූ විධිවිධානවල ව්‍යාප්තියට අගතියක් නොවන පරිදි ඒ බදු ගිවිසුම අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් දරන ලද යම් රජයේ ඉඩමක් බද්දකින් ප්‍රදානය කිරීමේ දී රජයේ ඉඩම් ආඥාපනතේ සඳහන් කිසිවක් එයට බලනොපෑ යුතු අතර, එසේ බලපාන බවට සැලකීම හෝ තේරුම් ගැනීම නොකළ යුතු ය.

(3) මේ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බදු ගිවිසුමක් යටතේ යම් ඉඩමක් හෝ ඉඩමක සම්බන්ධතාවක් ප්‍රදානය කරනු ලැබුවේ යම් සංවර්ධනකරුවකුට හෝ බලපත්‍ර දරන්නකුට ද, එම සංවර්ධනකරු හෝ බලපත්‍ර දරන්නා වෙත නිකුත් කරන ලද බලපත්‍රයක් අවලංගු කිරීමේ දී, එම බදු ගිවිසුමේ හෝ වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එම බදු ගිවිසුම එම බලපත්‍රය අවලංගු කිරීමේ දින සිට බලපවත්වන පරිදි අවලංගු වී ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

බදු ගිවිසුමක් අවලංගු කිරීම සම්බන්ධයෙන් නඩුවක් පැවරිය නොහැකි බව.

**33**. වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, 32 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ බදු ගිවිසුමක් අවලංගු කිරීම සම්බන්ධයෙන් අධිකාරියට හෝ එහි යම් නිලධරයකුට හෝ සේවා නියුක්තයකුට එරෙහිව කිසිම නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

**34**. (1) මේ පනතේ 32 වන වගන්තිය යටතේ අධිකාරිය විසින් යම් ඉඩමක් බදු දී ඇත්තේ, අවස්ථාවෝචිත පරිදි, යම් සංවර්ධන කරුවකුට ද නැතහොත් බලපත්‍රදරන්නකුට ද, එම සංවර්ධනකරු හෝ බලපත්‍රදරන්නා විසින් එම බලපත්‍රයේ වලංගු කාලසීමාව අවසන් වී මාස හයක් ඇතුළත හෝ බලපත්‍රය අවලංගු කරනු ලැබූ අවස්ථාවක, එසේ අවලංගු කරනු ලැබූ දින සිට මාස හයක් ඇතුළත ව්‍යාපෘතිය ආරම්භ කරනු ලැබූ හෝ කරගෙන යනු ලැබූ ස්ථානයෙන් හෝ වැඩබිමෙන් එම සංවර්ධනකරු හෝ බලපත්‍රදරන්නා සතුව ඇති යම් සවිකිරීම් ඇතුලු සියලු චංචල දේපළ නියම කරනු ලැබිය හැකි ආකාරයට ඉවත් කරනු ලැබිය යුතු බවට, එම සංවර්ධනකරුට හෝ බලපත්‍ර දරන්නාට නියම කරනු ලැබිය හැකි ය.

යම් ස්ථානයකින් හෝ වැඩ බිමකින් චංචල දේපළ ඉවත් කිරීම.

(2) අවස්ථාවෝචිත පරිදි, සංවර්ධනකරු හෝ බලපත්‍රදරන්නා, (1) වන උපවගන්තිය යටතේ අදාළ ස්ථානයෙන් හෝ වැඩ බිමෙන් තම දේපළ ඉවත් කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, එම සංවර්ධනකරු හෝ බලපත්‍ර දරන්නාගේ නොසැලකිල්ල නිසා නැවත බලගැන්විය හැකි බලශක්ති මූලාශ්‍රයට හෝ බදු දෙන ලද ඉඩමට සිදු වූ යම් අලාභයක් සඳහා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි වන්දි මුදලක් අධිකාරිය වෙත ගෙවීමට, අවස්ථාවෝචිත පරිදි, සංවර්ධනකරු හෝ බලපත්‍ර දරන්නා යටත් වේ.

## VII වන කොටස

## බලශක්ති කාර්යක්ෂමතාව සහ සංරක්ෂණ වැඩ සටහන්

**35**. (1) බලශක්ති සංරක්ෂණය සඳහා අවශ්‍ය පියවර සහ බලය එක්රැස් කිරීමෙන්, සැකසීමෙන්, පරිවර්තනය කිරීමෙන්, ප්‍රවාහනය කිරීමෙන්, ගබඩා කිරීමෙන් සහ සමජනනය කිරීමෙන්, එහි කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීම සහ සියලු පාරිභෝගික අංශවල බලශක්ති භාවිතා කිරීමේ තාප ප්‍රකෘති තාක්ෂණ ක්‍රම සැකසීම සහ ක්‍රියාත්මක කිරීම, මණ්ඩලයේ වගකීම විය යුතු ය.

බලශක්ති කාර්යක්ෂමතා සහ සංරක්ෂණ වැඩ සටහන්.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය වගකීම් ඉටු කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් :—

(අ) සියලු පාරිභෝගික අංශ විසින් තමාගේ විවිධ කටයුතුවල දී පාවිච්චි කරනු ලබන බලශක්තිය අපතේ යෑම වැළැක්වීම සඳහා ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ප්‍රතිපත්ති පියවර හඳුනා ගැනීම, සමාලෝචනය, සංවර්ධනය හා නිර්දේශ කිරීම;

(ආ) බලශක්ති කාර්යක්ෂමතාව, ඉල්ලුම් කළමනාකරණය හෝ සංරක්ෂණය පිළිබඳ සම්මන්ත්‍රණ, වැඩ මුළු සහ පාඨමාලා සංවිධානය කිරීම මගින් බලශක්ති කාර්යක්ෂමතාව සහ බලශක්ති සංරක්ෂණ ප්‍රතිපත්ති පියවර ප්‍රවර්ධනය කිරීම සහ ඊට පහසුකම් සැලසීම;

(ඇ) බලශක්ති ඉල්ලුම් කළමනාකරණය සහ සංරක්ෂණය සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීම සහ මහජනතාවට තොරතුරු සැපයීම;

(ඈ) බලශක්තිය සකසුරුවම් ලෙස භාවිත කිරීම ප්‍රවර්ධනය කරන සහ ශ්‍රී ලංකාවෙහි නැවත බලගැන්විය නොහැකි බලශක්ති මූලාශ්‍ර භාවිතය අඩු කරන බලශක්ති ඉල්ලුම් කළමනාකරණය පිළිබඳ යම් අංග හෝ සියලු අංග වැඩි දියුණු කිරීම;

(ඉ) බලශක්ති එක්රැස් කිරීමේ දී, සැකසුම් කිරීමේ දී, පරිවර්තනය කිරීමේ දී, ප්‍රවාහනය කිරීමේ දී, ගබඩා කිරීමේ දී සහ බලශක්ති භාවිතා කිරීමේ දී කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා දැනට පවතින තාක්ෂණය හඳුනා ගැනීම සහ ඒවා භාවිත කිරීමට පහසුකම් සැලසීම;

(ඊ) උපකරණ සහ මෙවලම් සඳහා බලශක්ති ලේබල් කිරීමේ වැඩ සටහන් ක්‍රියාත්මක කිරීම සහ පිල් ලකුණු පිහිටුවීම ;

(උ) ගොඩනැගිලිවල කාර්යක්ෂම ලෙස බලශක්තිය භාවිත කිරීම සඳහා සහ බලශක්ති අපතේ යෑම අඩු කිරීම සඳහා ප්‍රමිති, නියම, සංකේත, පියවර සහ සත්‍යායන චර්යා සහ ගොඩනැගිලි සංකේත, නිශ්චිතව දැක්වීම සහ ක්‍රියාත්මක කිරීම; සහ

(ඌ) බලශක්ති කාර්යක්ෂමතාවයේ, සංරක්ෂණයේ සහ ඉල්ලීම් කළමනාකරණයේ විශේෂිත අංග සම්බන්ධයෙන් පර්යේෂණ, සමීක්ෂණ සහ විමර්ශණ ආරම්භ කිරීම, ප්‍රවර්ධනය කිරීම, පැවැත්වීම සහ සම්බන්ධීකරණය කිරීම,

කළ යුතු ය.

**36**. (1) තත් කාර්ය සඳහා සාදනු ලබන නියම මගින්, සියලු බලශක්ති පාරිභෝගිකයන් විසින් අනුගමනය කළ යුතු නිශ්චිත බලශක්ති පරිභෝජන පිල් ලකුණු මණ්ඩලය විසින් කලින් කල පිහිටුවනු ලැබිය හැකිය . බලශක්ති පරිභෝජන පිල් ලකුණු පිහිටුවීම.

(2) (1) වන උපවගන්තිය යටතේ පිහිටුවන ලද පිල් ලකුණු අනුගමනය කරනු ලබන බවට සහතිකවීම සඳහා, මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවන්හි දී :—

(අ) තොරතුරු එක් රැස් කිරීම, තොරතුරු සත්‍යායනය කිරීම සහ වෙනත් යම් විමර්ශනයක් පැවැත්වීම සඳහා, අදාළ පුද්ගලයන්ගේ කැමැත්ත ඇතිව යම් පරිශ්‍රයකට, භූමියකට හෝ නිමාවකට ඇතුළු වී ඒවා පරීක්ෂා කිරීම ;

(ආ) බලශක්ති භාවිතය, නිෂ්පාදනය, ප්‍රසම්පාදනය සහ විකිණීමට අදාළ තොරතුරු ඉදිරිපත් කරන ලෙස යම් තැනැත්තකුට විධාන කිරීම ;

(ඇ) අදාළ සියලුම පුද්ගලයන්ගේ කැමැත්ත ඇතිව ගොඩනැගිලිවල සහ කර්මාන්ත පරිශ්‍රවල බලශක්ති පරිභෝජනය සමීක්ෂණය කිරීම සහ අදාළ නියෝජ්‍යායතනවල සම්බන්ධතාවය ඇතිව ඉඩම්, වාහන, නැව් සහ ගුවන් යානාවල ඉන්ධන කාර්යක්ෂමතාව සමීක්ෂණය කිරීම ;

(ඈ) අදාළ නියෝජ්‍යායතන සමග එකතු වී උපකරණවල බලශක්ති පරිභෝජන සීමා සහ බලශක්ති කාර්ය සාධන ප්‍රමිති නිශ්චිතව දැක්වීම සහ කලින් කළ නියම කරනු ලැබිය හැකි ආකාරයට උපකරණවලට අමුණා ඇති ලේබල් මත එම විස්තර ප්‍රදර්ශනය කළ යුතු බවට නියම කිරීම;

(ඉ) (ඈ) ඡේදය යටතේ නිශ්චිතව දක්වන ලද නියමයන්ට අනුකූල නොවන්නා වූ උපකරණ නිෂ්පාදනය, ආනයනය, විකිණීම හෝ මිල දී ගැනීම පාලනය කිරීම;

(ඊ) බලශක්ති පරිභෝජනයේ සළකුණු පිහිටුවීම හා ප්‍රතිශෝධනය කිරීම සහ අදාළ නියෝජ්‍යායතන සමග එකතු වී දැනට පවත්නා සහ යෝජිත ගොඩනැගිලි, කාර්මික පරිශ්‍ර, ඉඩම්, වාහන, නැව් සහ ගුවන් යානා සඳහා සීමා සහ පරිචය පද්ධති ක්‍රියාත්මක කිරීම; සහ

(උ) බලශක්තිය කාර්යක්ෂම ලෙස සහ සකසුරුවම් ලෙස භාවිත කිරීම හා බලශක්තිය සංරක්ෂණය කිරීම පිළිබඳ අධ්‍යාපනික ලේඛනාදිය සකස් කිරීම සහ අධ්‍යාපනික විෂයය මාලා නිර්දේශ කිරීමද,

කළ හැකිය.

පිළිගත හැකි සීමාවන් අභිබවා බලශක්ති පරිභෝජනය.

**37**. (1) ස්වකීය පරිශ්‍රවල හෝ නිමාවන්වල පිළිගත නොහැකි බලශක්ති මට්ටමක් යම් රාජ්‍ය ආයතනයක් ඇතුළු යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායම් විසින් 36 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් පිහිටුවන ලද පිල් ලකුණු අභිබවා පරිභෝජනය කරමින් සිටින බව මණ්ඩලයේ මතය වන අවස්ථාවක, බලශක්ති පරිභෝජනය පිළිගත හැකි මට්ටම් දක්වා අඩු කිරීම පිණිස, අවස්ථාවෝචිත පරිදි, ප්‍රතීත බලශක්ති විගණකවරයකු විසින් සම්පාදනය කරනු ලැබූ විස්තරාත්මක විගණන වාර්තාවක් සහ එම තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම් විසින් ගනු ලැබීමට යෝජිත ප්‍රතිකර්ම පියවර පිළිබඳ විස්තරාත්මක ක්‍රියා සැලැස්මක්, මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස එම තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායමෙන් ඉල්ලා සිටිනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ඉදිරිපත් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබූ විට විස්තරාත්මක විගණන වාර්තාවක් සහ ක්‍රියා සැලැස්මක් ඉදිරිපත් කිරීමට අපොහොසත් වීම සහ මණ්ඩලය විසින් එම සැලැස්ම අනුමත කිරීමෙන් පසු එය ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වීම, මෙම පනත යටතේ වරදකි.

(3) (1) වන උපවගන්තිය යටතේ යම් විස්තරාත්මක ක්‍රියා සැලැස්මක් මණ්ඩලය වෙත ඉදිරිපත් කරනු ලබන ලෙස ඉල්ලා ඇති යම් තැනැත්තකු හෝ තැනැත්තන් කණ්ඩායමක් විසින්, එම සැලැස්ම ක්‍රියාත්මක කරනු ලබන අවස්ථාවේ දී ඒ සඳහා සාධාරණ තැනැත්තකු විසින් අපේක්ෂා කළ හැකි වියදමට වඩා වැඩිපුර වැය වූ මුදලක් වේ නම්, ඒ සඳහා අදාළ තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායම සමග එකගත්වය ඇතිව මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු සාධාරණ වන්දි මුදලක් ලබා ගැනීම සඳහා, එම තැනැත්තා හෝ තැනැත්තන් කණ්ඩායමට හිමිකමක් තිබිය යුතු ය.

බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් ආදීන් ප්‍රතීතනය කිරීම.

**38**. (1) මණ්ඩලය විසින් නියම කරනු ලබන සුදුසුකම් ඇති තැනැත්තන් :—

(අ) කාර්යක්ෂම බලශක්ති කළමනාකරණයට අදාළ පරිචය ප්‍රවර්ධනය කිරීමේ දී සහාය විය යුතු බලශක්ති කළමනාකරුවන් ;

(ආ) බලශක්ති විගණන පැවැත්වීම සඳහා සුදුසුකම් ලත් තැනැත්තන් වන බලශක්ති විගණකවරුන් ; සහ

(ඇ) බලශක්ති සේවා සපයන්නන්,

වශයෙන් පත් කරනු ලැබ ඔවුන් ශ්‍රේණිගත කළ යුතු අතර,එසේ පත් කරනු ලබන්නන්හට ප්‍රතීතන සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සහතිකයක් නිකුත් කරනු ලැබූ සෑම තැනැත්තකුට ම මණ්ඩලය විසින් කලින් කළ පවත්වනු ලබන විභාගයකට පෙනී සිටීමට නියම කරනු ලැබිය හැකි අතර, මණ්ඩලය විසින් ඉල්ලා සිටිනු ලබන අවස්ථාවක දී මණ්ඩලය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාල විරාමයන් තුළ, කාර්ය සාධන සමාලෝචන ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. මණ්ඩලය විසින් පත් කරනු ලබන සියලුම ප්‍රතීත බලශක්ති කළමනාකරුවන්, බලශක්ති විගණකවරුන් සහ බලශක්ති සේවා සපයන්නන් පිළිබඳ ලේඛනයක් මණ්ඩලය විසින් පවත්වාගෙන යා යුතු ය.

බලශක්ති විගණකවරුන්ගේ ක්‍රියා කලාපය.

**39**. (1) මණ්ඩලය විසින් කලින් කල තත්කාර්ය සඳහා සාදනු ලබන රීති මගින් :—

(අ) අදාල නිමාවල හෝ පරිශ්‍රයන්හි බලශක්ති විගණනයක් පැවැත්විය යුතු බවට නියම කරනු ලැබිය යුතු රාජ්‍ය ආයතන ඇතුළු තැනැත්තන් හෝ තැනැත්තන් කණ්ඩායම් ;

(ආ) බලශක්ති විගණනයක් පැවැත්විය යුතු බවට නියම කරනු ලබන ආකාරය සහ පවත්වනු ලැබිය යුත්තේ කවර කාලසීමාවන් තුළ දී ද යන්න,

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(2) බලශක්ති විගණනයක්, ප්‍රතීත බලශක්ති විගණකවරයකු විසින් පවත්වනු ලැබිය යුතු අතර, ඔහු විසින් පවත්වන ලද බලශක්ති විගණනයේ ප්‍රතිඵල පිළිබඳව වාර්තාවක් මණ්ඩලයට ඉදිරිපත් කරන ලෙස එම විගණකවරයාට නියම කරනු ලැබිය යුතු ය.

ග්‍රාමීය බලශක්ති සේවා ලබාදීම.

**40.** අදාළ පළාත් බලධාරීන්ගේ සහයෝගය ඇතිව මණ්ඩලය විසින් :—

(අ) නවීන හෝ වාණිජ බලශක්ති සේවාවලට ප්‍රවේශයක් නොමැති හෝ සීමිත ප්‍රවේශයක් ඇති, රටේ ග්‍රාමීය හෝ ඈත ප්‍රදේශවලට ඔරොත්තු දෙන බලශක්ති සේවා ලබාදීමෙන් ග්‍රාමීය ජනතාවගේ මූලික ගෘහස්ථ බලශක්ති අවශ්‍යතා සැලැස්වීමට ;

(ආ) බලශක්ති සපයා නොමැති ප්‍රදේශ හඳුනාගැනීම, ඒවායේ බලශක්ති අවශ්‍යතා සහ දැනට ඇති සම්පත් හඳුනාගැනීම සහ සුදුසු තාක්ෂණවේද ප්‍රවර්ධනය කිරීමෙන් රටේ ග්‍රාමීය හා ඈත ප්‍රදේශවලට බලශක්ති සේවා බෙදාහැරීම සඳහා දීර්ඝකාලීන සැලැස්මක් සකස් කිරීමට ; සහ

(ඇ) අදාළ රාජ්‍ය නියෝජ්‍යායතනවල සහයෝගය ඇතිව, ග්‍රාමීය බලශක්ති ව්‍යාපෘති සංවර්ධනය පිළිබඳ මාර්ගෝපදේශ ගොඩනැගීම ඇතුළුව ග්‍රාමීය බලශක්ති බෙදාහැරීම පිළිබඳ ආයෝජන ප්‍රවර්ධනයන් සඳහා හිතකර පරිසරයක් ගොඩනැගීම සහ එම මාර්ගෝපදේශ අපේක්ෂිත ආයෝජකයන් අතර ව්‍යාප්ත කිරීමට,

අවශ්‍ය විය හැකි පියවර ගනු ලැබිය යුතු ය.

බලශක්ති ප්‍රතිපත්ති සංවර්ධනය සහ තොරතුරු කළමනාකරණය.

**41.** ශ්‍රී ලංකාව තුළ බලශක්ති සම්පාදනය පිළිබඳ සුරක්ෂිත භාවය සහ විශ්වාසනීයත්වය ප්‍රවර්ධනය කිරීම සහ පිරිවැය සඵලතාවය සහතික කිරීම සඳහා මණ්ඩලය වගකිව යුතු අතර, එම කාර්ය සඳහා :—

(අ) බලශක්ති ක්ෂේත්‍රයේ කාර්ය සාධනය පරීක්ෂා කිරීම, ආයතනික සහ උප ක්ෂේත්‍ර සැලසුම් සමාලෝචනය කිරීම සහ ඒකාබද්ධ කිරීම, ප්‍රතිපත්ති විශ්ලේෂණය, ජාතික බලශක්ති ප්‍රතිපත්තිය සහ ක්‍රමෝපායයන්ට අනුකූලවීම සමාලෝචන කිරීම සහ පොදුවේ බලශක්ති ක්ෂේත්‍රය පිළිබඳව ද, විශේෂයෙන් ම නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත් සහ බලශක්ති කාර්යක්ෂමතාව පිළිබඳව ද අමාත්‍යාංශය වෙත ප්‍රතිපත්තිමය නිර්දේශ ඉදිරිපත් කිරීම ;

(ආ) සමීක්ෂණ සහ විමර්ශන පැවැත්වීම, ජනලේඛන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව දත්ත එකතු කිරීම හා ගොනු කිරීම, ජාතික බලශක්ති ශේෂපත්‍ර වාර්තා සහ සාමාන්‍යයෙන් බලශක්ති ක්ෂේත්‍රයට අදාළ සහ විශේෂයෙන් ම බලශක්ති සම්පත් පරිවර්තනය, සැපයුම, භාවිතය, සංරක්ෂණය සහ ආර්ථිකයට අදාළ වූ ද තොරතුරු සපයන වෙනත් ලේඛන, ප්‍රකාශයට පත්කිරීම;

(ඇ) ප්‍රතිපත්ති පියවර හඳුනාගෙන ඒවා විශ්ලේෂණය කිරීම සහ මිල ප්‍රතිපත්ති, බදු අයකිරීම සහ ආයතනික වැඩපිළිවෙල ඇතුළු මූල්‍ය දිරිදීම් සහ දිරිදීම් වැලැක්වීම්වලට අදාළ නිශ්චිත ප්‍රතිපත්තිමය පියවර අමාත්‍යාංශයට සහ වෙනත් අදාළ නියෝජ්‍යායතනවලට නිර්දේශ කිරීම ;

(ඈ) බලශක්ති ව්‍යාපාරයන්හී නියැලී සිටින හෝ බලශක්ති වටිනාකමක් ඇති සම්පත් පිළිබඳ බලය ඇති ආයතන, සමාගම් හෝ පුද්ගලයන්ගේ බලශක්ති සම්පත්, පර්යේෂණ සංචිත, පරිවර්තන පහසුකම් සහ පරිවර්තන මට්ටම්, ගබඩා පහසුකම් සහ ගබඩා මට්ටම්, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීමේ ක්‍රම, අලෙවි ය, ගණුදෙනුකරුවන්, පිරිවැය මිල, විකිණීමෙන් ලැබෙන ආදායම, අලාභ, සේවා නියුක්තයන් සහ සංවර්ධන සැලසුම්වලට අදාළ තොරතුරු ලබාගැනීම ; සහ

(ඉ) භාවිතයට ගත හැකි හෝ දැනට පවත්නා බලශක්ති සැපයුම් පහසුකම් පිළිබඳ සහ ඒවායේ භාවිතය සහ පරිභෝජනය පරීක්ෂාකොට තොරතුරු ලබාගැනීම කරනු ලැබිය හැකිය.

බලශක්ති පරිභෝජනය පිළිබඳ වාර්ෂික වාර්තාව.

.**42**. (1) ඉහතින් ම වූ වර්ෂය තුළ ශ්‍රී ලංකාවේ බලශක්ති ක්ෂේත්‍රයෙහි කාර්ය සාධනය පිළිබඳ වාර්තාවක් වාර්ෂිකව අමාත්‍යවරයා වෙත මණ්ඩලය විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, පාර්ලිමේන්තුවේ සලකා බැලීම සඳහා අමාත්‍යවරයා විසින් එම වාර්තාව පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ ස්වකීය වාර්ෂික වාර්තාව පිළියෙල කිරීමේ දී, 38 වන වගන්තිය යටතේ පත් කරන ලද යම් තැනැත්තකුගේ සේවය මණ්ඩලය විසින් ලබාගත යුතු ය.

## VIII වන කොටස

## මූල්‍ය

අධිකාරියේ ප්‍රාග්ධනය.

**43**. අධිකාරියේ මූලික ප්‍රාග්ධනය රුපියල් මිලියන පන්සියයක් විය යුතු අතර, එම මුදල අමාත්‍යවරයා විමසා මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි වූ වාරිකවලින් ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරියේ අරමුදල.

**44**. (1) අධිකාරියට එහි ම අරමුදලක් තිබිය යුතු ය. අධිකාරියේ අරමුදලට පහත දැක්වෙන සියලු මුදල් බැර කරනු ලැබිය යුතු ය:—

(අ) අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය වශයෙන් ලැබුණු මුදල් ;

(ආ) අධිකාරියේ භාවිතය සඳහා පාර්ලිමේන්තුව විසින් කලින් කළ සම්මත කරනු ලබන මුදල් ;

(ඇ) මේ පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම සඳහා පනවනු ලබන ගාස්තුවලින් අධිකාරියට ලැබෙන මුදල් ; සහ

(ඈ) ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත යම් මූලාශ්‍රයකින් ණය, පරිත්‍යාග, ත්‍යාග හෝ ප්‍රදාන වශයෙන් අධිකාරියට ලැබෙන මුදල් ; සහ

(ඉ) 32 වන වගන්තිය යටතේ බදු කුලී වශයෙන් අධිකාරියට ලැබෙන මුදල්.

(2) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් පියවීම සඳහා අවශ්‍ය සියලු මුදල්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පාශානිභූත ඉන්ධන නිෂ්පාදන ආනයනය කිරීම මත සෙස් බද්ද පැනවීම.

**45**. (1) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, කලින් කළ තීරණය කරනු ලැබිය හැකි අනුප්‍රමාණ අනුව ගණන් බලනු ලබන සෙස් බද්දක්, ආනයනය කරනු ලබන සියලුම පාශානිභූත ඉන්ධන නිෂ්පාදන මත පැනවීම, අයකිරීම සහ ගෙවීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සෙස් බද්ද වශයෙන් පනවනු ලබන මුදල් ප්‍රමාණය එවැනිම නියමයක් මගින් වෙනස් කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියමයක් ම ගැසට් පත්‍රයේ පළ කිරීමේ දින සිට බලාත්මක විය යුතු අතර, එසේ පළ කිරීමේ දින සිට මාස හතරක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියමයක් එම අනනුමතයේ දින සිට ප්‍රත්‍යාදිෂ්ඨ කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු නමුත්, ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) මෙම වගන්තිය (235 අධිකාරය වූ) රේගු ආඥාපනතේ කොටසක් වන ආකාරයට සලකා බලාත්මක විය යුතු අතර, ඒ අනුව එම ආඥාපනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) මේ වගන්තිය (235 වන අධිකාරය වූ) යටතේ අයකර ගනු ලබන සෙස් බද්දෙන් ලැබෙන මුදල්, රේගු අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින්, මේ පනතේ 46 වන වගන්තිය මගින් පිහිටුවන ලද බලශක්ති අරමුදලේ බැරට මාසිකව ගෙවනු ලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ අයකරනු ලබන සෙස් බද්ද යම් ආනයන බද්දක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ පනවනු ලබන වෙනත් යම් සෙස් බද්දකට අමතරව විය යුතු ය.

**46**. (1) (මේ පනතේ "බලශක්ති අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අරමුදල.

(2) බලශක්ති අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු යː—

(අ) ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන රුපියල් මිලියන පන්සියයක ආරම්භක ප්‍රදානය;

(ආ) 45 වන වගන්තිය යටතේ පනවනු ලබන සෙස් බද්දෙන් ලැබෙන මුදල්;

(ඇ) ශ්‍රී ලංකාවේ අංගාර වත්කම් කළමනාකරණය කිරීම සඳහා සංවර්ධනකරුවන්ගෙන් අයකළ හැකි ගාස්තු;

(ඈ) මේ පනතේ 19 වන වගන්තිය සහ 26 වන වගන්තිය යටතේ සංවර්ධනකරුවන් සහ බලපත්‍රදරන්නන් විසින් රාජ්‍ය භාගය හෝ ගාස්තු වශයෙන් ගෙවන ලද මුදල්;

(ඉ) යම් වෘත්තීයමය සේවා ලබාදීම සඳහා මණ්ඩලය විසින් අයකරනු ලබන ගාස්තු;

(ඊ) මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති සඳහා ඉඩම් හෝ ඉඩම් සම්බන්ධතා බදු දීමෙන් බදු කුලිය වශයෙන් ලැබෙන මුදල් ;

(උ) මධ්‍යම ජාලය තුළ වූ සහ මධ්‍යම ජාලයෙන් බැහැර වූ ව්‍යාපෘතිවල නියැලීම සඳහා අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන ඉල්ලුම්පත්‍ර සලකා බැලීම සඳහා අයකරනු ලබන ගාස්තු ; සහ

(ඌ) රාජ්‍ය හා පෞද්ගලික අංශයේ සංවිධාන සඳහා සහ ඒවා වෙනුවෙන් නැවත බල ගැන්විය හැකි බලශක්ති සම්පත් සංවර්ධනය සහ බලශක්ති කාර්යක්ෂමතාව, බලශක්ති සංරක්ෂණය සහ ඉල්ලීම් කළමනාකරණය වැඩි දියුණු කිරීම හා සම්බන්ධ ව්‍යාපෘති භාර ගැනීමෙන් උපයන ගාස්තු සහ බෙදා ගනු ලබන ඉතිරි කිරීම්.

(3) බලශක්ති අරමුදලින් :—

(අ) තෝරාගත් නැවත බලගැන්විය හැකි බලශක්ති මත පදනම් වූ බලශක්ති පරිවර්තන පිරියත සඳහා වූ සහනාධාර;

(ආ) බලශක්ති කාර්යක්ෂම උපකරණ සහ තාක්ෂණය භාවිත කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා වූ සහනාධාර;

(ඇ) කාර්මික, තාප අධික යෙදවුම් ඇතුළු ඉන්ධනවලට හැරවීම සඳහා වූ ප්‍රාග්ධන සහනාධාර;

(ඈ) ශ්‍රී ලංකාවේ බලශක්ති සුරක්ෂිතභාවය වැඩි දියුණු කිරීම සඳහා ජන මාධ්‍ය සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීමේ දී දරනු ලබන වියදම්; සහ

(ඉ) බලශක්ති සංරක්ෂණ පියවර යොදා ගැනීම දිරිමත් කිරීම සඳහා සහ රටේ සියලු ප්‍රදේශවල ග්‍රාමීය බලශක්ති සේවා දියුණු කිරීම සඳහා යම් සමිතියකට හෝ ප්‍රජාපාදක සංවිධානවලට දිරි දීමනා හෝ වෙනත් සමාන මූල්‍ය ආධාර ලබාදීම.

සඳහා අවශ්‍ය මුදල්, ගෙවනු ලැබිය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් උචිත යයි නිශ්චය කරනු ලැබිය හැකි ආකාරයට බලශක්ති අරමුදලේ බැරට ඇති මුදල්, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකගත්වය ඇතිව ආයෝජනය කරනු ලැබිය හැකි අතර, එවැනි යම් ආයෝජනයකින් උපචිත වන සියලු ආදායම් එම අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(5) බලශක්ති අරමුදල විධිමත් කිරීම සහ පවත්වාගෙනයාම සම්බන්ධයෙන් ද, ඊට අදාළ ගිණුම් පොත් යථා පරිදි පවත්වාගෙන යාම සම්බන්ධයෙන් ද, මණ්ඩලය වගකිව යුතු ය.

(6) මේ පනතේ 50 වන සහ 51 වන වගන්තිවල විධිවිධාන බලශක්ති අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

**47**. (1) බලශක්ති කාර්යක්ෂමතාවට අදාළ යම් ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා ණය ඉල්ලුම් කරන ආයෝජකයන් වෙනුවෙන් ඇප ලබාදීමේ කාර්යය සඳහා (මේ පනතෙහි "ඇප අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල" නම් වූ අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. සුනිත්‍ය බලශක්ති ඇප අරමුදල.

(2) ඇප අරමුදලට පහත දැක්වෙන මුදල් බැර කරනු ලැබිය යුතු ය :—

(අ) ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන රුපියල් මිලියන පණහක ආරම්භක ප්‍රාග්ධන ප්‍රදානය;

(ආ) ආයෝජකයන්ට ලබාදෙන ඇප මුදලින් සියයට 0.5 කට නොඅඩු වාර්ෂික වාරිකයක්;

(ඇ) ඇප ලබාදෙන ආයෝජකයන්ගෙන් අයකරගනු ලබන පොළිය, සේවා ගාස්තු සහ දණ්ඩන; සහ

(ඈ) අධිකාරියේ අරමුදලින් ලැබිය හැකි සියලු මුදල්.

(3) ඇපකරුවන් වශයෙන් ගෙවිය යුතු මුදල් ප්‍රමාණය සහ ඇපවල ස්වභාවය, ඇපයක් ලබාගැනීමට හිමිකම් ලැබීමට තිබිය යුතු සුදුසුකම් සහ ඇප අරමුදල කළමනාකරණය කිරීම හා සම්බන්ධ වෙනත් සියලු කාරණා, මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය යුතු ය.

(4) මේ පනතේ 50 වන සහ 51 වන වගන්තිවල විධිවිධාන ඇප අරමුදලේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මණ්ඩලයේ ණයට ගැනීමේ බලතල.

48. (1) ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී මණ්ඩලය විසින් දරනු ලබන සියලු වියදම් ආවරණය කිරීම සඳහා මණ්ඩලයට අවශ්‍ය සියලු මුදල්, මණ්ඩලය විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් දෙනු ලබන අනුමතය ඇතිව, අයිරාවක් මගින් හෝ අන්‍යාකාරයකට තාවකාලිකව ණයට ගනු ලැබිය හැකි ය :

එසේ වුව ද, මේ උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් ලබාගන්නා යම් තාවකාලික ණය මුදලක් සම්බන්ධයෙන් ගෙවීමට ඇති සියලු මුදල්වල එකතුව, අමාත්‍යවරයා විසින් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා තීරණය කරනු ලබන මුදලක් නොඉක්මවනු ලැබිය යුතු ය.

(2) "සුනිත්‍ය බලශක්ති අධිකාරිය සෘණ පත්‍ර" යනුවෙන් සඳහන් කරනු ලබන සෘණ පත්‍ර නිකුත් කිරීම මගින්, (1) වන උපවගන්තිය යටතේ තාවකාලික ණය ලබාගැනීමෙන් හැර අධිකාරියේ ක්‍රියාකාරී ප්‍රාග්ධනයේ වියදම් සඳහා, මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, දෙන ලද අමාත්‍යවරයාගේ කැමැත්ත ඇතිව මණ්ඩලය විසින් මුදල් ණයට ගනු ලැබිය හැකි ය.

(3) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, දෙන ලද අමාත්‍යවරයාගේ අනුමතය ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කොන්දේසිවලට අනුකූලව, සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සෘණ පත්‍ර නිකුත් කිරීම, පැවරීම, ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම, බේරුම් කිරීම සහ අවලංගු කිරීම කරනු ලැබිය යුතු ය.

රජයේ ඇපය.

49. (1) 48 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද සුනිත්‍ය බලශක්ති අධිකාරියේ සෘණපත්‍ර මත අයවිය යුතු මුල් මුදල සහ පොළිය ආපසු ගෙවන බවට, මුදල් විෂයය භාර අමාත්‍යවරයා ඇපවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සපයා ඇති ඇපයක් ඉටු කිරීම සඳහා අවශ්‍ය වන යම් මුදලක් පාර්ලිමේන්තුවේ පූර්ව අනුමතය ඇතිව ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සපයා ඇති ඇපයක් ඉටු කිරීමේ දී ඒකාබද්ධ අරමුදලින් ගෙවනු ලබන යම් මුදලක්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන පරිදි වූ අනුප්‍රමාණවලට අනුව සහ එවැනි ආකාරයකට සහ එවැනි කාලයක් තුළ දී, පොළිය ද සමඟ අධිකාරිය විසින් ආපසු ගෙවනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ ඇපයක් ලබා දුන් වහාම, ඒ ඇපයට අදාළ ප්‍රකාශයක් මුදල් විෂයභාර අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවෙහි සභාගත කළ යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ සපයා ඇති ඇපයක් ඉටුකිරීමේ දී ඒකාබද්ධ අරමුදලින් යම් මුදලක් ගෙවනු ලැබූ අවස්ථාවක දී, ඇපය වශයෙන් ගෙවන ලද මුදල පිළිබඳ ප්‍රකාශයක් මුදල් විෂයය භාර අමාත්‍යවරයා විසින් වහාම පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

**50**. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. ගිණුම් සහ විගණනය.

(2) අධිකාරියේ ආදායම් සහ වියදම්, වත්කම් සහ බැරකම් සහ වෙනත් සියලු ගණුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය.

(3) අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් සහ ඊට අදාළව රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීමට අදාළ වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව අදාළ විය යුතු ය.

**51**. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටසේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අධිකාරියේ මූල්‍ය පාලනය සහ ගිණුම් සම්බන්ධයෙන් අදාල විය යුතු ය. 1971 අංක 38 දරන මුදල් පනතේ II වන කොටස අදාළවීම.

## IX වන කොටස

### අධිකාරියේ කාර්ය මණ්ඩලය

**52**. (1) මණ්ඩලයේ එකඟත්වය ඇතිව, අමාත්‍යවරයා විසින් අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා ලෙස තැනැත්තකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු ය. අධිකාරියේ අධ්‍යක්ෂ-ජනරාල්වරයා.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම්වලට පැමිණ සිටීමට ද, එම රැස්වීම්වල දී කථා පැවැත්වීමට ද අධ්‍යක්ෂ-ජනරාල්වරයාට හිමිකමක් ඇති නමුත්, එවැනි රැස්වීම්වල දී ඡන්දය පාවිච්චි කිරීමට හිමිකමක් නොතිබිය යුතු ය.

(3) මණ්ඩලයේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවානියුක්තයන්ගේ පරිපාලනමය පාලනය ඇතුළු අධිකාරියේ සියලු කටයුතු පවත්වාගෙන යාම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වගකිව යුතු ය.

(4) අමාත්‍යවරයා විමසා මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි පාරිශ්‍රමිකයක්, අධ්‍යක්ෂ-ජනරාල්වරයාහට ගෙවනු ලැබිය යුතු ය.

(5) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ-ජනරාල්වරයා, මණ්ඩලයේ එකඟත්වය ඇතිව සහ තත්කාර්යය සඳහා හේතු දක්වා අමාත්‍යවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ස්වකීය බලතල පැවරිය හැකි බව.

**53**. මේ පනත මගින් අධ්‍යක්ෂ-ජනරාල්වරයා වෙත පවරා ඇති හෝ වෙන්කර දී ඇති යම් කර්තව්‍යයක් හෝ කාර්යයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අවශ්‍ය යයි සලකනු ලබන අවස්ථාවක දී සහ මණ්ඩලයේ අනුමතය ඇතිව අධිකාරියේ යම් නිලධරයකු වෙත පවරනු ලැබිය හැකි අතර එම නිලධරයා එම කර්තව්‍යය සහ කාර්ය අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ විධානයට සහ පාලනයට යටත්ව ඉටු කිරීම හෝ කිරීම කළ යුතු ය.

අධ්‍යක්ෂ-ජනරාල්වරයා තාවකාලිකව පැමිණ නොසිටීම.

**54**. රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා අධ්‍යක්ෂ-ජනරාල්වරයාට සිය කර්තව්‍ය හෝ කාර්යවලින් යම් කර්තව්‍යයක් හෝ කාර්යයක් ඉටු කිරීමට හෝ කිරීමට නොහැකි අවස්ථාවක, එසේ පැමිණ නොසිටින කාලය තුළ දී ඔහු වෙනුවෙන් වැඩබැලීම සඳහා අධිකාරියේ යම් ජ්‍යෙෂ්ඨ නිළධරයකු, අමාත්‍යවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව පත් කරනු ලැබිය හැකි ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලය පත් කිරීම.

**55**. (1) මේ පනත යටතේ ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටුකිරීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන නිලධරයන් සහ සේවානියුක්තයන් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන් සහ වෙනත් සේවානියුක්තයන් හට තත්කාර්ය සඳහා සාදන ලද රීති මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට සහ එවැනි

අනුප්‍රමාණවලට අනුව පාරිශ්‍රමික ගෙවිය යුතු අතර, එසේ තීරණය කරනු ලබන සේවා කොන්දේසිවලටද ඔවුන් යටත් විය යුතු ය.

අධිකාරියේ කාර්ය මණ්ඩලයට රාජ්‍ය නිලධරයන් පත් කිරීම.

**56**. (1) රාජ්‍ය සේවයේ යම් නිලධරයෙක් මණ්ඩලයේ ඉල්ලීම පිට සහ එම නිලධරයාගේ සහ රාජ්‍ය පරිපාලන විෂයය භාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ කැමැත්තක් ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් සඳහා අධිකාරියේ කාර්යය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්ත ඇතිව, එම කාර්යය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(3) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබූ අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනා ගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, ඔහුට සහ ඔහු සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

(4) යම් ගිවිසුමක් යටතේ යම් නිශ්චිත කාලයක් සඳහා ආණ්ඩුවට සේවය කිරීමට එකඟවී ඇති යම් තැනැත්තෙක් අධිකාරිය විසින් සේවයේ නියුක්ත කරනු ලබන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියට කරනු ලබන යම් සේවා කාලයක්, එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්ය සඳහා ආණ්ඩුවට කරන ලද සේවයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

රාජ්‍ය සංස්ථාවල හෝ උසස් අධ්‍යාපන ආයතනවල නිලධරයන් අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කිරීම.

**57**. (1) මණ්ඩලයේ ඉල්ලීම පිට රාජ්‍ය සංස්ථාවක යම් නිලධරයෙක් හෝ සේවකයෙක්, එම නිලධරයාගේ හෝ සේවකයාගේ කැමැත්ත සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලයේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් සඳහා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය

හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්තක් ඇතිව, මණ්ඩලය සහ එම රාජ්‍ය සංස්ථාවේ පාලක මණ්ඩලය එකඟවන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළු වෙනත් නියම සහ කොන්දේසි මත, එම කාර්ය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ ඉල්ලීම පිට උසස් අධ්‍යාපන ආයතනයක යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු එම නිලධරයාගේ හෝ සේවා නියුක්තයාගේ කැමැත්ත සහ උසස් අධ්‍යාපන ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයාගේ කැමැත්තක් ඇතිව මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාලයක් සඳහා එම නිලධරයා හෝ සේවා නියුක්තයා අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය ; නැතහොත් එවැනිම කැමැත්තක් ඇතිව මණ්ඩලය සහ එම ප්‍රධාන විධායක නිලධරයා එකඟවන විශ්‍රාම වැටුප් හෝ අර්ථසාධක අරමුදල්වලට අදාළ නියම සහ කොන්දේසි ඇතුළු වෙනත් නියම සහ කොන්දේසි මත, කාර්යය මණ්ඩලයට ස්ථිරව පත් කරනු ලැබිය යුතු ය.

(3) අවස්ථාවෝචිත පරිදි, (1) වන උපවගන්තිය හෝ (2) උපවගන්තිය යටතේ අධිකාරියේ කාර්ය මණ්ඩලයට යම් තැනැත්තකු තාවකාලිකව පත් කරනු ලැබූ අවස්ථාවක, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකුට අදාළ විනය පාලනයට එම තැනැත්තා ද යටත් විය යුතු ය.

## X වන කොටස

## සාමාන්‍ය

අමාත්‍යවරයා විසින් විශේෂ සහ සාමාන්‍ය විධාන නිකුත් කළ හැකි බව.

**58**. මේ පනත යටතේ වූ බලතල ක්‍රියාත්මක කිරීමට, කාර්ය කිරීමට සහ කර්තව්‍ය ඉටුකිරීමට අදාළව අමාත්‍යවරයා විසින් මණ්ඩලය වෙත විශේෂ හෝ සාමාන්‍ය විධාන නිකුත් කරනු ලැබිය හැකි අතර, එම විධාන බලාත්මක කිරීම මණ්ඩලයේ කාර්යය වන්නේ ය.

වාර්තා පවත්වාගෙන යාමට සහ වාරවාර්තා ඉදිරිපත් කිරීමට නියම කිරීමේ බලය.

**59**. (1) මේ පනත යටතේ වූ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ කාර්ය සඳහා මණ්ඩලය විසින් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සියලුම සංවර්ධනකරුවන් සහ බලපත්‍රදරන්නන් වෙත:—

(අ) මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි ආකෘතියකට අනුව, වාර වාර්තා පවත්වාගෙන යාම කරන ලෙස ; සහ

(ආ) මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලැබිය හැකි කාරණා සම්බන්ධයෙන් සහ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය හැකි කාල පරාසවලදී සහ ආකෘතියකට අනුව, වාර වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස,

යම් බලපත්‍රයක් නිකුත් කරනු ලැබ ඇති සියලු ම සංවර්ධනකරුවන් සහ බලපත්‍ර දරන්නන් වෙත මණ්ඩලය විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) වාර්තා පවත්වාගෙන යාමට, (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ නියම කර ඇති සියලු සංවර්ධනකරුවන් සහ බලපත්‍ර දරන්නන් විසින්, එසේ පවත්වාගෙන යනු ලබන වාර්තා, අවස්ථාවෝචිත පරිදි, එම සංවර්ධනකරු හෝ බලපත්‍රදරන්නා වෙත නිකුත් කරන ලද බලපත්‍රයේ වලංගු කාලය අවසන් වීමෙන් පසු අවුරුදු හයකට නොවැඩි කාලයක් සඳහා, ආරක්ෂා කළ යුතු ය.

තොරතුරු ඉල්ලා සිටීමට අධිකාරියට ඇති බලය.

**60**. (1) මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් නිලධරයකු විසින් ලිඛිත දැන්වීමක් මගින් එහි නිශ්චිතව දැක්වෙන කාලය ඇතුළත, එම දැන්වීමේ සඳහන් බලශක්ති ප්‍රභේද අත්කර ගැනීම, ගබඩා කිරීම, ප්‍රවාහනය, ප්‍රේෂණය සහ එසේ කිරීමේදී දරන ලද පිරිවැය පිළිබඳ තොරතුරු ඉදිරිපත් කරන ලෙස සහ එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන ලේඛන ඉදිරිපත් කරන ලෙස, යම් තැනැත්තකුට නියම කරනු ලැබිය හැකි ය . එම දැන්වීමේ නිශ්චිතව සඳහන් කාලය ඇතුළත එහි සඳහන් නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීම මේ උපවගන්තිය යටතේ එවැනි දැන්වීමක් ලැබුණු තැනැත්තකුගේ කාර්යය වන්නේ ය:

එසේ වුව ද, කිසියම් නීතියක යම් විධිවිධානයක් මගින් එම තොරතුරු හෙළි කිරීම හෝ එම ලේඛන ඉදිරිපත් කිරීම තහනම් කර ඇත්නම්, එම තොරතුරු ඉදිරිපත් කරන ලෙස හෝ එම ලේඛන ඉදිරිපත් කරන ලෙස නියම කිරීමට මණ්ඩලයට හෝ මණ්ඩලය විසින් තත් කාර්යය සඳහා බලය පවරන ලද යම් තැනැත්තකුට හැකි වන බවට, මේ උපවගන්තියේ සඳහන් කිසිවක් කියවා තේරුම් නොගත යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, යම් වාර වාර්තාවක් හෝ තොරතුරක් ඉදිරිපත් කරන හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කරන තැනැත්තකුගේ කැමැත්ත ඇතිව මිස නැතහොත් මේ පනත යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ කාර්යය කිරීමේ දී සහ කර්තව්‍ය ඉටු කිරීමේ දී හැර 59 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර වාර්තාවක

අඩංගු තොරතුරු සහ මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක අඩංගු තොරතුරු සහ මේ වගන්තිය යටතේ නිකුත් කරන ලද දැන්වීමක් ප්‍රකාර ඉදිරිපත් කරන ලද යම් තොරතුරක් එසේ ඉදිරිපත් කරන ලද ලේඛනයක අන්තර්ගත කරුණු මණ්ඩලය විසින් ප්‍රසිද්ධ කිරීම හෝ වෙනත් යම් තැනැත්තෙකුට සන්නිවේදනය කිරීම නොකළ යුතු ය.

ගොඩනැගිලි සහ පරිශ්‍රවලට ඇතුළු වී පරීක්ෂා කිරීම.

**61**. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු හෝ මණ්ඩලය වෙනුවෙන් තත් කාර්යය සඳහා විශේෂයෙන් ලිඛිතව බලය දෙන ලද අධිකාරියේ යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු, මේ පනත යටතේ මණ්ඩලයේ යම් බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හෝ ඉටු කිරීමේ කාර්යය සඳහා,යම් සෝදිසි කිරීමක්, සමීක්ෂණයක්, පරීක්ෂා කිරීමක් හෝ විමර්ශනයක් කර ගෙන යාමේ කාර්යය සඳහා යම් සාධාරණ වේලාවක දී යම් ගොඩනැගිල්ලකට, නිමාවකට හෝ පරිශ්‍රයකට ඇතුළු වීම නීත්‍යානුකූල විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් සෝදිසි කිරීමක්, සමීක්ෂණයක්, පරීක්ෂා කිරීමක් හෝ විමර්ශනයක් කරගෙන යාමේ කාර්යය සඳහා අවස්ථාවෝචිත පරිදි, ඒ ගොඩනැගිල්ලට, නිමාවට හෝ පරිශ්‍රයන්ට ඇතුළුවීම සඳහා ඒ ගොඩනැගිල්ලේ, නිමාවේ හෝ පරිශ්‍රයේ අයිතිකරුගේ හෝ පදිංචිකරුගේ හෝ ඒ ගොඩනැගිල්ල, නිමාව හෝ පරිශ්‍රයභාර තැනැත්තාගේ අනුමතය, ලබා ගත යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ ලබා ගැනීමට අවශ්‍ය කරන අනුමතය සාධාරණ නොවන ලෙසින් ප්‍රතික්ෂේප කරන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඒ ගොඩනැගිල්ලට, නිමාවට හෝ පරිශ්‍රයට ඇතුළු වී අවශ්‍ය කරන සෝදිසි කිරීම, සමීක්ෂණය, පරීක්ෂා කිරීම හෝ විමර්ශනය කරගෙන යාම සඳහා, අවස්ථාවෝචිත පරිදි, ඒ ගොඩනැගිල්ල, නිමාව හෝ පරිශ්‍රය පිහිටා ඇති අධිකරණ බල ප්‍රදේශයේ මහෙස්ත්‍රාත්වරයකුගෙන් අධිකාරිය විසින් යම් නිලධරයකුට බලය දෙමින්, මණ්ඩලයට සෝදිසි වරෙන්තුවක් ලබාගත හැකි ය.

(4) මේ වගන්තිය යටතේ මණ්ඩලයේ යම් සාමාජිකයකු් අධිකාරියේ යම් නිලධරයකු හෝ සේවානියුක්තයකු ඔහුගේ කාර්යය ඉටු කිරීමේ දී එයට බාධා කරන්නා වූ සෑම තැනැත්තකුම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

වැරදි.

**62**. (අ) මේ පනතේ යම් විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් හෝ රීතියක් කඩකරන හෝ ඊට අනුකූලව ක්‍රියාකිරීම පැහැරහරින ;

(ආ) 59 වන වගන්තිය යටතේ මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට නියමිත යම් වාර වාර්තාවක් එසේ ඉදිරිපත් කිරීම සිදු නොකරන හෝ ප්‍රතික්ෂේප කරන ;

(ඇ) 60 වන වගන්තිය යටතේ මණ්ඩලය විසින් නියම කරනු ලැබූ විට, යම් තොරතුරක් ඉදිරිපත් කිරීම හෝ යම් ලේඛනයක් ඉදිරිපත් කිරීම සිදු නොකරන හෝ ප්‍රතික්ෂේප කරන ; හෝ

(ඈ) 59 වන වගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද වාර වාර්තාවක දැන දැනම යම් අසත්‍ය ප්‍රකාශයක් කරන හෝ 60 වන වගන්තිය යටතේ දැන දැනම අසත්‍ය තොරතුරු ඉදිරිපත් කරන,

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරිපිට පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් ලක්ෂ එකකට නොවැඩි දඩයකට හෝ අවුරුදු දෙකකට නොවැඩි කාලයක් සඳහා දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකටම සහ එම වරද දිගටම සිදු කිරීමේ දී වරදකරුවීමෙන් පසු එම වරද සිදුකරන එක් එක් දිනය සඳහා දිනකට රුපියල් එක් දහස බැගින් වූ දඩයකට එම තැනැත්තා යටත්විය යුතු ය.

පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන වැරදි.

**63**. මේ පනත යටතේ වූ යම් වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් සිදු කරනු ලබන අවස්ථාවක දී :—

(අ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නම්, එම වරද සිදුකළ අවස්ථාවේ දී එම පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, ප්‍රධාන විධායක නිලධරයකු, ලේකම්වරයකු හෝ වෙනත් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තකු ම; හෝ

(ආ) එම පුද්ගල මණ්ඩලය සංස්ථාවක් නොවන්නේ නම්, එම වරද සිදුකළ අවස්ථාවේ දී එම මණ්ඩලයේ සභාපතිවරයා, කළමනාකරු, ලේකම්වරයා හෝ වෙනත් සමාන නිලධරයකු වූ සෑම තැනැත්තකු ම,

එම වරද සිදු වූයේ තමාගේ අනුදැනුම නොමැතිව බව හෝ එම වරද සිදුවීම වැළැක්වීම සඳහා තමා නිසි උද්යෝගයෙන් ක්‍රියාකළ බව ඔප්පු කරන්නේ නම් මිස, එම වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය.

වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු බව.

**64**. (1) යම් අධිකරණයක් ඉදිරිපිට අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී අධිකාරියට ගෙවනු ලැබූ හෝ අයකර ගන්නා ලද නඩු ගාස්තු, අධිකාරියේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(2) අවස්ථාවෝචිත පරිදි, අමාත්‍යවරයාගේ හෝ මණ්ඩලයේ විධාන මත හෝ මේ පනත යටතේ යම් තැනැත්තකු විසින් කරන ලද හෝ කරනු ලැබූ බවට උද්දේශිත යම් ක්‍රියාවක් සම්බන්ධයෙන්, යම් අධිකරණයක් ඉදිරිපිට යම් තැනැත්තකුට එරෙහිව හෝ යම් තැනැත්තකු විසින් පවරනු ලැබූ සිවිල් හෝ අපරාධ නඩුවක දී, මණ්ඩලයේ සාමාජිකයකු විසින්, කමිටුවේ සාමාජිකයකු විසින් හෝ උපදේශක කමිටුවක සාමාජිකයකු විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ වෙනත් සේවානියුක්තයකු විසින් දරන ලද යම් වියදමක්, එම සිවිල් හෝ අපරාධ නඩුවේ දී එම තැනැත්තා විසින් අයකරගනු ලැබුවේ නම් මිස, අධිකරණය විසින් එම ක්‍රියාව සද්භාවයෙන් කරනු ලැබූ බවට පිළිගතහොත්, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

අධිකාරිය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

**65**. අධිකාරිය (27 වන අධිකාරය වූ ) අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, එම පනතේ විධිවිධාන ඒ අනුව තේරුම් ගත යුතු ය.

සාමාජිකයන්, නිලධරයන් ආදින් රාජ්‍ය සේවකයන් ලෙස සැලකිය යුතු බව.

**66**. (19 වන අධිකාරයවූ ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා මණ්ඩලයේ, කමිටුවේ සහ උපදේශක කමිටුවේ සාමාජිකයන් සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයා සහ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තයන් රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

නියෝග.

**67**. (1) නියම කළ යුතු බවට මේ පනත මගින් නියමිත කාරණා සම්බන්ධයෙන් හෝ නියෝග සෑදීමට බලය පවරා ඇති සියලු කාරණා සම්බන්ධයෙන්, අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලබන දිනයේ සිට හෝ නියෝගයේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි පසු දිනයක දී ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.

(3) සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් පසු හැකි පහසු ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ කලින් කරන ලද කිසිවකට ඉන් අගතියක් නොවිය යුතු ය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය සම්බන්ධ නිවේදනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

**68**. (1) මේ පනත යටතේ රීති සෑදීමට බලය පවරා ඇත්තේ හෝ නියම කර ඇත්තේ යම් කාරණා සම්බන්ධයෙන් ද, එවැනි යම් කාරණාවක් හෝ සියලු කාරණා සම්බන්ධයෙන් මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

(2) මේ වගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලබන යම් රීතියක් අමාත්‍යවරයා විසින් අනුමත කොට ඉන්පසු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

**69**. (1) 1985 අංක 2 දරන බලශක්ති සංරක්ෂණ අරමුදල පනත මෙයින් ඉවත් කරනු ලැබේ. ඉවත් කිරීම් සහ ශේෂ කිරීම්.

(2) ඉහත කී පනත ඉවත් කිරීම නොතකා —

(අ) බලශක්ති සංරක්ෂණ අරමුදල විසින් එළඹුන හෝ ලියා අත්සන් කළ සහ නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී බලාත්මකව පවතින සියලු කොන්ත්‍රාත්, ගිවිසුම් සහ සාධන පත්‍ර , අධිකාරිය විසින් එළඹුන හෝ ලියා අත්සන් කළ කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ සාධන පත්‍ර ලෙස සලකනු ලැබිය යුතු ය;

(ආ) බලශක්ති සංරක්ෂණ අරමුදල විසින් හෝ එයට එරෙහිව පවරන ලද සහ නියමිත දිනයට පෙරාතුව වූ දිනයේ දී යම් අධිකරණයක හෝ විනිශ්චය අධිකාරියක විභාග වෙමින් පවතින සියලු සිවිල් සහ අපරාධ නඩු, අධිකාරිය විසින් හෝ එයට එරෙහිව පවරන ලද සිවිල් සහ අපරාධ නඩු ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඈ) බලශක්ති සංරක්ෂණ අරමුදලේ සියලු ණය, බැරකම් සහ බැඳීම් අධිකාරියේ ණය, බැරකම් සහ බැඳීම්, ලෙස සලකනු ලැබිය යුතු ය;

(ඇ) යම් නඩුවක දී හෝ නීති කෘත්‍යයක දී නිසි අධිකරණ බලය ඇති අධිකරණයක් විසින් බලශක්ති සංරක්ෂණ අරමුදලේ වාසියට හෝ ඊට එරෙහිව ප්‍රකාශයට පත් කරන ලද සෑම තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක්, නියමිත දිනයේ සිට බලපැවැත්වෙන පරිදි අධිකාරියේ වාසියට හෝ ඊට එරෙහිව ප්‍රකාශයට පත් කරන ලද තීන්දු ප්‍රකාශයක්, ආඥාවක් හෝ නඩු තීන්දුවක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව බලාත්මක විය යුතු ය ; තව ද,

(ඉ) නියමිත දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ධුර දරන්නා වූ සහ :—

(i) අධිකාරිය විසින් සේවා නියුක්තිය අර්පණය කරනු ලැබ එය භාර ගන්නා වූ බලශක්ති සංරක්ෂණ අරමුදලේ සෑම නිලධරයෙක් ම සහ සේවකයෙක් ම, නියමිත දිනයට පෙරාතුවවූ දිනයේ දී ඔහුට අදාළ වූ සේවා නියුක්තිය පිළිබඳ නියම සහ කොන්දේසිවලට වඩා අවාසි සහගත නොවන නියම සහ කොන්දේසි මත, අධිකාරියේ සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය ; නැතහොත්

(ii) අධිකාරියේ සේවා නියුක්තිය අර්පනය කරනු නොලැබූ හෝ එසේ අර්පනය කරනු ලැබ එය භාර නොගත් බලශක්ති සංරක්ෂණ අරමුදලේ සෑම නිලධරයකුටම සහ සෑම සේවකයකුටම, මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලබන වන්දි මුදලක් ලබා ගැනීමට හිමිකමක් තිබිය යුතු ය.

**70**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ :— අර්ථ නිරූපණය.

"ජෛව ස්කන්ධ බලශක්තිය" යන්නෙන්, ජීව විද්‍යාත්මක ක්‍රියාවලියක් මගින් ජනනය වූ, ද්‍රව්‍යක් ඇවිලීම, පැසවීම සහ ජීර්ණය වීම වැනි ක්‍රියාවලියක් මගින් පරිවර්තනය කිරීම තුලින් ලබාගත හැකි බලශක්තිය අදහස් වේ ;

"කමිටුව" යන්නේ, මේ පනතේ 10 වන වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව අදහස් වේ ;

"සංවර්ධනකරු" යන්නෙන්, මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක් පවත්වාගෙන යාම සඳහා මේ පනතේ 18 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ ;

"බලශක්ති සංරක්ෂණය" යන්නෙන්, සේවය සම්පූර්ණයෙන් නැවැත්වීම මගින් හෝ සේවය සීමා කොට ලබාදීම මගින්, සේවා භාවිතා කරන්නෙකුට ලබා දෙනු ලබන අත්‍යවශ්‍ය නොවන සේවා අත්හිටුවීම අදහස් වේ ;

"බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීම" යන්නෙන්, යම් සේවයක තත්වයට බලපෑමක් නොවන පරිදි එම විශේෂිත සේවාව ලබාදීම සඳහා ඇත්තවශයෙන් අවශ්‍ය වූ බලශක්ති පරිභෝජනය අඩුකිරීම සඳහා ප්‍රයත්න දැරීම, අදහස් වේ ;

"හරිත අරමුදල්" යන්නෙන්, සහනදායි නියමයන් මත ලබාගත හැකි හෝ හැකි නොවන්නා වූ, පෘථිවියේ පරිසරය සහ පරිසර විද්‍යාව ආරක්ෂා කිරීම සඳහා ගනු ලබන ක්‍රියා මාර්ග සඳහා ලබාදෙන අරමුදල් අදහස් වේ ;

"ජලවිදුලි බලශක්තිය" යන්නෙන්, ප්‍රතික්‍රියා සහ ජවනීය ක්‍රියාවලි හරහා ගමන් කරන ජල ධාරාවකින් ජනනය කළ හැකි බලශක්තිය අදහස් වේ ;

"මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති ව්‍යාපෘති" යන්නෙන්, ප්‍රදේශයක් ඇතුළත පරිභෝජනය සඳහා බලශක්තියේ එක් ආකාරය වූ නැවත බලගැන්විය හැකි බලශක්තියක් වෙනත් ආකාරයක බලශක්තියකට පරිවර්තනය කරන්නා වූ ද, යම්

සංවර්ධන ප්‍රදේශයක සිදුකරනු ලබන්නා වූ හෝ නොලබන්නා වූ ද නිමාවක් අදහස් වේ ;

"මධ්‍යම ජාලයෙන් බැහැර වූ බලශක්ති පාරිභෝගික සමිතිය" යන්නෙන්, ජාතික විදුලිබල සැපයුමට සම්බන්ධ කර නොමැති වූ ද, බෙදා හැරීමේ ජාලයක් හරහා තම සාමාජිකයන්ට විදුලිබලය ජනනය කර බෙදාහැරීමේ අරමුණින් යම් විශේෂිත භූගෝලීය ප්‍රදේශයක් ඇතුළත නැවත බලගැන්විය හැකි බලශක්ති නිපදවීම සහ ප්‍රයෝජනයට ගැනීම සඳහා, අදාළ පළාත් සභාව වෙත යථා පරිදි ලියාපදිංචි වූ බලශක්ති භාවිත කිරීමේ ප්‍රජාවක් නියෝජනය කරන යම් සංවිධානයක් අදහස් වේ ;

"මධ්‍යම ජාලය තුළ වූ බලශක්ති ව්‍යාපෘති" යන්නෙන්, යම් ආකාරයක නැවත බලගැන්විය හැකි බලශක්තියක් විදුලිබලය බවට පරිවර්තනය කරන්නා වූ ද එසේ ජනනය කළ විදුලිබලය ලංකා විදුලිබල මණ්ඩලය විසින් ක්‍රියාත්මක කරන ජාතික විදුලිබල පද්ධතියට එකතු කරන සහ යම් සංවර්ධන ප්‍රදේශයක් ඇතුළත ක්‍රියාත්මක කරනු ලබන නිමාවක් අදහස් වේ ;

"බලපත්‍ර දරන්නා" යන්නෙන්, මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක නියැලී සිටීම සඳහා මේ පනතේ 25 වන වගන්තියේ (අ) ඡේදය යටතේ බලපත්‍රයක් නිකුත් කරනු ලැබූ තැනැත්තකු අදහස් වේ ;

"ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව" යන්නෙන්, 2002 අංක 35 දරන ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව අදහස් වේ;

"නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත්" යන්නෙන්, තම ප්‍රයෝජනය සඳහා අනාගත පරම්පරාව විසින් යොදා ගැනීමට ඇති හැකියාවට බාධා නොවන පරිදි, ශ්‍රී ලංකා ජනරජයේ භූමි ප්‍රදේශය ඇතුළත යොදා ගත හැකි සූර්යතාප හෝ භූ තාප ක්‍රියාකාරිත්වයක් මගින් පැන නගින චාලක හෝ තාප බලශක්ති මූලාශ්‍ර අදහස් වන අතර, ඊට ජෛව ස්කන්ධ බලශක්තිය, ජල විදුලිබල ශක්තිය, සූර්ය බලශක්තිය සහ සුළං බලශක්තිය ඇතුළත් වේ;

"ග්‍රාමීය බලශක්ති සේවා" යන්නෙන්, ජාතික විදුලිබල සැපයුම හෝ ඛණිජ තෙල් නිෂ්පාදන බෙදාහැරීමේ මාධ්‍යය වැනි නවීන වාණිජ බලශක්ති සැපයුම් මාධ්‍යය මගින් සපුරාලිය නොහැකි ග්‍රාමීය ප්‍රජාවගේ හෝ ග්‍රාමීය ව්‍යාපෘතියක මූලික බලශක්ති අවශ්‍යතා අදහස් වේ;

"සූර්ය බලශක්තිය" යන්නෙන්, අවහිර කිරීම මගින් සාන්ද්‍රීකරණය කිරීමෙන් සහ නාභිගත කිරීමෙන් හෝ වෙනත් යම් මාර්ගයකින් සූර්ය විකිරණයෙන් ලබාගත හැකි බලශක්තිය අදහස් වේ;

"සුනිත්‍ය බලශක්තිය" යන්නෙන්, අනාගතයේ දී සමාන මට්ටමක උපයෝගීතාවයක් සැපයීම සඳහා බලශක්ති සම්පතකට ඇති හැකියාවට බාධා නොවන පරිදි ප්‍රයෝජනවත් කාර්යයන් සඳහා භාවිත කළ හැකි යම් බලශක්ති සම්පතක් අදහස් වේ;

"සුළං බල ශක්තිය" යන්නෙන්, ප්‍රතික්‍රියා සහ ජවනීය ක්‍රියා වැනි ක්‍රියාවලින් හරහා චලනය වන වාත ස්කන්ධයකින් ලබාගත හැකි බලශක්තිය අදහස් වේ;

දැනට පවත්නා ව්‍යාපෘති.

**71**. (1) නියමිත දිනයේ දී, මේ පනතේ අර්ථානුකූලව මධ්‍යම ජාලය තුළ වූ හෝ මෙහි මධ්‍යජාලයෙන් බැහැර වූ ව්‍යාපෘතියක් පවත්වාගෙන යාමේ නියැලී සිටින සියලු තැනැත්තන්හට, නියමිත දිනයේ සිට අවුරුදු එකක කාලයක් තුළ දී තත්කාර්ය සඳහා මණ්ඩලය වෙත කරනු ලබන ඉල්ලීමක් මත, එම ව්‍යාපෘතිය නොකඩවා කරගෙන යාම සඳහා බලපත්‍රයක් නිකුත් කරනු ලැබීමට හිමිකම් ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරනු ලබන සෑම බලපත්‍රයක්ම මේ පනතේ විධිවිධානවලට යටත් විය යුතු අතර, එම බලපත්‍රය :—

(අ) මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට, 18 වන වගන්තියේ සඳහන් අවුරුදු විස්සක කාලසීමාවෙන් ව්‍යාපෘතිය බලගැන්වූ දින සිට වූ කාලසීමාව අඩු කරනු ලැබීමෙන් පසු ඉතිරිවන කාලසීමාව සඳහා; සහ

(ආ) මධ්‍යම ජාලයෙන් බැහැර වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් වන විට, නියම කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් සඳහා.

වලංගු විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**72**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය [3(2) වගන්තිය]

පත්කිරීම සඳහා නුසුදුසුකම්.

1. යම් තැනැත්තකු –

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වේ නම් හෝ එසේ වන්නේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන්නේ නම් හෝ එසේ වී සිටීම අවසන් වුවහොත්;

(ඇ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක බල පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් තැනැත්තකු ලෙස තීරණය කරනු ලැබ සිටී නම් හෝ එසේ ප්‍රකාශයට පත් කරනු ලැබ සිටී නම්;

(ඈ) ශ්‍රී ලංකාවේ හෝ වෙනත් යම් රටක අධිකරණයක් විසින් පනවන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩන නියමයක් ඔහු විසින් ගත කරමින් සිටී නම් හෝ ගතකොට ඇත්නම්;

(ඉ) විෂමාචාරය හේතුවෙන් මණ්ඩලයේ සාමාජිකත්වයෙන් ඉවත්කොට ඇත්නම්,

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කිරීමට හෝ පත්කළ සාමාජිකයකු ලෙස මණ්ඩලයේ නොකඩවා කටයුතු කිරීමට නුසුදුස්සකු වන්නේ ය.

සාමාජිකයන්ගේ ධූර කාලය.

2. සෑම පත්කල සාමාජිකයකුම මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධූරය අත්හලහොත් මිස, පත්කල දින සිට අවුරුදු තුනක කාලයක් ධූර දැරිය යුතු අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස නැවත පත්කිරීම සඳහා සුදුස්සකු වන්නේ ය.

සාමාජිකයන්ගේ ධූර කාලය අවසන් වීම.

3. (1) ශාරීරික හෝ මානසික දුබලතා නිසා හෝ අමාත්‍යවරයාගේ මතය අනුව අධිකාරියට අපහාසයක් ගෙන දීමට ඉඩ ඇති යම් ක්‍රියාවක් හෝ දෙයක් නිසා සභාපතිවරයා හෝ මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු ගැසට් පත්‍රයේ පළ කරනු ලැබි ය හැකි යම් නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(2) සභාපතිවරයා හෝ වෙනත් යම් පත්කල සාමාජිකයකු ධූරය අතහැරයාමේ දී එම සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්තවීම සඳහා වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

සාමාජිකයන් පැමිණ නොසිටීම.

4. මණ්ඩලයේ යම් පත්කළ සාමාජිකයකු රෝගාතුරවීම, අබලතාවකට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා මාස තුනකට නොඅඩු කාලයක් තම කාර්ය කිරීමට තාවකාලිකව නොහැකිවන අවස්ථාවක, එම නොහැකියාව පිළිබඳව අමාත්‍යවරයා වෙත ලිඛිතව දැන්වීම එම සාමාජිකයාගේ කාර්යය වන්නේ ය. එවිට 3 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය සැලකිල්ලට ගනිමින් අමාත්‍යවරයා විසින් ඔහු පැමිණ නොසිටින කාලය තුළ ඔහු වෙනුවෙන් කටයුතු කිරීම සඳහා වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

5. මුදල් විෂයය භාර අමාත්‍යවරයා විමසා, අමාත්‍යවරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ආකාරයකට සහ එවැනි අනුප්‍රමාණවලට අනුව මණ්ඩලයේ සාමාජිකයන්ට පාරිශ්‍රමික ගෙවනු ලැබිය හැකි ය.

සාමාජිකයන්ගේ පාරිශ්‍රමික.

6. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටී නම් මණ්ඩලයේ සියලු රැස්වීම්වල මුලසුන ඔහු විසින් දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටියහොත් පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන්ගේ එක් අයකු, මුලසුන දැරීම සඳහා තෝරා ගත යුතු ය.

මණ්ඩලයේ රැස්වීම.

(2) නිලබලයෙන් පත්වූ යම් සාමාජිකයකුට යම් නොවැළැක්විය හැකි හේතු නිසා යම් රැස්වීමකට පැමිණීමට නොහැකි නම් ඔහු විසින් ලිඛිතව කරනු ලබන පූර්ව දැන්වීමක් මගින් මණ්ඩලයේ එම රැස්වීමට පැමිණීම සඳහා එම සාමාජිකයා විසින් වෙනත් යම් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය පස්දෙනකු විය යුතු අතර, එම රැස්වීම්වල කටයුතු සම්බන්ධයෙන් වූ කාර්ය පටිපාටිය සහ එම රැස්වීම්වල කටයුතු මණ්ඩලය විසින් පාලනය කළ යුතු ය.

7. මණ්ඩලය විසින් සිදුකරනු ලබන හෝ සිදුකිරීමට යෝජිත යම් ව්‍යාපාර කටයුත්තක් පිළිබඳව කෙලින්ම හෝ අන්‍යාකාරයකින් යම් සම්බන්ධතාවක් ඇති මණ්ඩලයේ යම් සාමාජිකයකු, එම ව්‍යාපාරික කටයුත්ත පිළිබඳව සාකච්ඡා කරනු ලබන මණ්ඩලයේ රැස්වීමක දී එම සම්බන්ධතාව පිළිබඳව හෙළි කරනු ලැබිය යුතු ය. එම හෙළි කිරීම මණ්ඩලයේ වාර්තාවල වාර්තාගත කළ යුතු අතර, එම ව්‍යාපාර කටයුත්ත සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කරනු ලබන යම් සාකච්ඡාවකට එම සාමාජිකයා සහභාගි නොවිය යුතු මෙන්ම, එම සාකච්ඡාව පවතින අතරතුර හෝ එම තීරණය ගනු ලබන අවස්ථාවේදී එම සාමාජිකයා එම රැස්වීමෙන් ඉවත් විය යුතු ය.

සාමාජිකයන් විසින් තම සම්බන්ධතාව හෙලිකළ යුතු බව.

8. මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීම නිසා හෝ සාමාජිකයන් පත් කිරීමෙහිලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් , කටයුත්තක් හෝ තීරණයක් බල රහිත නොවිය යුතු ය.

පත්වීමක ඇති යම් දෝෂයක් නිසා රැස්වීමේ කටයුතු, ක්‍රියාවන් හෝ තීරණයන් අවලංගු නොවිය යුතු බව .

9. අධිකාරියේ මුද්‍රාව :—

අධිකාරියේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන්ගේ භාරයේ තිබිය යුතු ය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය; සහ

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව මිස සහ තමන් පැමිණ සිටින බවට සාක්ෂි වශයෙන් අදාළ සාධන පත්‍රයට අත්සන් තබන සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට හැර, කිසිම සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තබනු නොලැබිය යුතු ය.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.